# 2023

# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# Progress Report







## මහජන ආරක්ෂක අමාත්‍යාංශය
## பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
## Ministry of Public Security

# ප්‍රගති වාර්තාව

# 2023

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

14 වන මහළ, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය**



මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගනිමින්, මත්උවදුරින් හා බියෙන් සැකෙන් තොර නීත්‍යානුකූල පුරවැසි අයිතීන් සුරැකි සමාජයක් බිහිකිරීම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය වේ. ඒ වෙනුවෙන් දායකත්වයන් ලබා දෙන සුවිශේෂී ආයතන වන ශ්‍රී ලංකා පොලීසිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මෙම අමාත්‍යාංශය යටතේ කටයුතු කරනු ලබයි. රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවට අනුගතව නූතන ලෝකයට ගැලපෙන ආර්ථික ප්‍රතිපත්තියක් සැකසීමේ රජයේ ප්‍රමුඛ අභිමතාර්ථය ඉටුකරගැනීමට මෙම අමාත්‍යාංශය කැපවීමෙන් කටයුතු කරමින් සිටී. 2023 වසර සඳහා අමාත්‍යාංශයට සහ අමාත්‍යාංශයට අයත් ආයතනවලට රජය මගින් ලබා දෙන ලද ප්‍රතිපාදනවලින් 2023 සැප්තැම්බර් මස 30 දින දක්වා කරන ලද කාර්යයන්හි ප්‍රගතිය ඇතුලත් 2024 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන **"ප්‍රගති වාර්තාව 2023"** ප්‍රකාශනයට මහජන ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් සටහනක් එක් කරන්නට ලැබීම ඉමහත් ප්‍රීතියට කරුණකි.

සියලු රට වැසියන්ට බියෙන් සැකෙන් තොරව ජීවත්විය හැකි දේශයක් බිහිකරලීමේදී මත්ද්‍රව්‍ය උවදුර, සංවිධානාත්මක අපරාධ, මංකොල්ලකෑම්, ළමා අපයෝජන හා ස්ත්‍රී දූෂණ සමාජයෙන් තුරන්කිරීමට කටයුතු කිරීම මාගේ අමාත්‍යාංශයට පැවරී ඇති සුවිශේෂී ප්‍රමුඛතාවන් අතර ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම රට තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන ජීවිතහානි, ආබාධිත තත්ත්වයට පත්වීම් හා දේපළහානි අවම කරමින් විධිමත් රථ වාහන ධාවන පාලන සැලැස්මක් ස්ථාපිත කිරීම ද අප අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රමුඛ කාර්යයකි. අදට ගැලපෙන කළමණාකරණ ක්‍රම හා නවීන තාක්ෂණය සමඟ ඩිජිටල්කරණය තුළින් ඵලදායි හා ගුණාත්මක සේවාවක් ජනතාව වෙනුවෙන් ලබාදීමටත්, ඒ තුළින් දැනට සිදුවන රිය අනතුරු අවම කර ගැනීමටත් අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම ස්වකීය කාර්යයන් මනා කාර්යක්ෂමතාවයකින් ඉටු කරමින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ආගමන හා විගමනයට අදාළ කාර්යයන් ඉටු කිරීමත්, රටේ සෑම පෙදෙසකටම සිය සේවාවන් සපයමින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පුද්ගල අනන්‍යතාවයට අදාළ කාර්යයන් ඉටු කරමින් සිටී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවලට සහාය දක්වමින් සිය සේවාවන් සපයනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම, නියාමනය සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි.

මහජන ආරක්ෂාව තහවුරු කිරීම, මත්උවදුර තුරන් කිරීම, පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීම මඟින් සුරක්ෂිත රටක් බිහිකිරීමට අවශ්‍ය මහජන සේවාවන් ඉටුකරන මාගේ අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු ඉතාමත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන්, ව්‍යාපෘති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. එම භාරධූර වගකීම ඉටුකිරීම සඳහා මා හට නායකත්වය ලබා දෙන ගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් මාගේ විශේෂ ස්තූතිය පිරිනමන අතර කැපවීමෙන් ක්‍රියාකරන අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයත් ආයතන ප්‍රධානීන් ඇතුළු සියළුම ආයතනික කාර්යය මණ්ඩලයන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමින් ඉදිරි සැලසුම් සාර්ථක කර ගැනීමට සැමගේ සහයෝගය උපරිමව ලබා දෙනු ඇතැ'යි අපේක්ෂා කරමි.

**ටිරාන් අලස්**

**මහජන ආරක්ෂක අමාත්‍ය**

**ලේකම්තුමාගේ පණිවුඩය**



2024 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන **"ප්‍රගති වාර්තාව 2023"** ප්‍රකාශනයට මූලික වශයෙන් ඇතුළත් වන්නේ 2022 මැයි මස 27 දිනැති අංක 2281/41, එමෙන්ම 2022 ඔක්තෝබර් මස 05 දින අංක 2300/24 යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර මගින් ප්‍රකාශිත වූ මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතනවල 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 වන දින දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය හා 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්වල සාරාංශය වේ.

මෙම අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යයන් සහ කර්තව්‍යයන් මනාව පරිපාලනය කරමින් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ නායකත්වය හා මගපෙන්වීම යටතේ අදාළ පාර්ශවකාර ආයතන සමඟ ඒකාබද්ධව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමේ ඇතුලත් සුවිශේෂී කාර්යයන් බොහොමයක් සැප්තැම්බර් 30 දින වන විට ඉටුකර ගැනීමට හැකිවීම අප සාමූහිකව ලබාගත් ජයග්‍රහණයකි. නාස්තිය හා දූෂණය පිටු දකිමින් ප්‍රශස්ත ඵලදායිතාවක් අත්පත් කර ගැනීම පිණිස මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කරමින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මෙහෙය වනු ලැබේ.

රජය මගින් ක්‍රියාත්මක ජාතික ප්‍රතිපත්ති මත පදනම්ව අමාත්‍යාංශ විෂය පථයට අයත්වන ආයතන වෙත පනත් මගින් ලබාදී ඇති ව්‍යවස්ථාපිත රෙගුලාසි වලට අනුගතව ඉටු කරනු ලබන මහජන සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යය වේ. මහජන ආරක්ෂාව තහවුරු කිරීමට අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු මැඩලීමට ක්‍රියා මාර්ග ගැනීම, සමාජ විරෝධී අපරාධ මැඩ පැවැත්වීම, කාන්තාවන්ට හා ළමා පරපුරට රැකවරණය සැලසීමේ වැඩ පිළිවෙල සකස් කිරීම, ගමනා ගමනය පහසුකරවීමට ක්‍රමවත් රථ වාහන සැලසුම් සහ නියාමන ක්‍රමවේදයක් හා ඒ සම්බන්ධ නීති පද්ධතිය ශක්තිමත් කිරීම යන සුවිශේෂී කාර්යයන් සිදුකරන ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමඟ එක්ව සමාජය මත් උවදුරෙන් නිදහස් කර ගැනීම සඳහා ද ක්‍රියා කරනු ලබමින් සිටී.

ආගමන හා විගමන කටයුතු මනා කාර්යක්ෂමතාවයකින් හා මහජන හිතකාමී අයුරින් ඉටු කරමින් ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය නිකුත් කිරීමට අදාළ කාර්යයන් රැසක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඉටු කරනු ලබයි. සිය දේශය තුළදී සියළුම රටවැසියන්ට තම අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන සේ, රටේ සෑම පෙදෙසකටම සිය සේවාවන් සපයමින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යය හා සම්බන්ධ කටයුතු කරගෙන යනු ලැබේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් මත්ද්‍රව්‍ය භාවිතය හා අන්තරායක ඖෂධ දුර්භාවිතය වැලැක්වීම හා පාලනය කිරීමට ක්‍රියා කරනු ලබයි. එමෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි.

මෙවන් භාරධූර කාර්යයන් ඉටුකිරීම පිණිස අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සම්පාදනය කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, පසු විපරම් කිරීමට හා ඇගයීමට නිසි මාර්ගෝපදේශකත්වය ලබා දෙන ගරු අමාත්‍යතුමාට සුභාශිංෂන පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමි. එසේම අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයටත්, ඒ යටතේ ක්‍රියාත්මක ආයතන ප්‍රධානීන් හා සමස්ත කාර්යය මණ්ඩලයන්ට ද මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර, ඉදිරියටත් අමාත්‍යාංශය සඳහා වන සැලසුම් සාර්ථක කර ගැනීමට සැමගේ සහයෝගය උපරිමව ලබා දෙනු ඇතැ'යි අපේක්ෂා කරමි.

**වියානි ගුණතිලක**
**ලේකම්**

## පටුන

පිටු අංකය


01. මහජන ආරක්ෂක අමාත්‍යාංශය 01
1.1 හැඳින්වීම 01 - 04
1.2 අමාත්‍යාංශයේ කාර්තුමය ප්‍රගතිය 05 - 08
1.2.1. මහජන දුක්ගැනවිලි කඩිනමින් සමනය කිරීම පිණිස 08 - 09
1.2.2. සංවර්ධන වැඩසටහන් අධීක්ෂණ කටයුතු සිදු කරමින් 09 - 10
1.2.3. අන්තර් සහයෝගීතාවය ලබා ගනිමින් 10 - 11
1.3. මූල්‍ය ප්‍රගතිය 12
1.4. අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026 12

02. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන 13
2.1. ශ්‍රී ලංකා පොලීසිය 13
2.1.1. හැඳින්වීම 13
2.1.2. ශ්‍රී ලංකා පොලීසියේ කාර්තුමය ප්‍රගතිය 14 - 19
2.1.3. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය 19
2.1.4. 2023 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති 20
2.1.5. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024-2026 21- 22
2.1.6. මූල්‍ය ප්‍රගතිය 23

2.2. විශේෂ කාර්ය බලකාය 24
2.2.1. හැඳින්වීම 24
2.2.2. විශේෂ කාර්ය බලකාය කාර්තුමය ප්‍රගතිය 25 - 27
2.2.3. මූල්‍ය ප්‍රගතිය 28
2.2.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026 28

2.3. ආගමන විගමන දෙපාර්තමේන්තුව 29
2.3.1. හැඳින්වීම 29
2.3.2. ආගමන විගමන දෙපාර්තමේන්තුවේ කාර්තුමය ප්‍රගතිය 29 - 33
2.3.3. මූල්‍ය ප්‍රගතිය 33
2.3.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026 34
2.3.5. අභියෝග හා උපායමාර්ග 35
2.3.6. 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනාගත සැලසුම් 35

2.4. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව 36
2.4.1. හැඳින්වීම 36
2.4.2. ආයතනයේ ක්‍රියාකාරකම් වල කාර්තුමය ප්‍රගතිය 37 - 41
2.4.3. මූල්‍ය ප්‍රගතිය 41
2.4.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026 41 - 42

2.5. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය 43
2.5.1. හැඳින්වීම 43
2.5.2. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්තුමය ප්‍රගතිය 43 - 45
2.5.3. මූල්‍ය ප්‍රගතිය 46
2.5.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026 46

2.6. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 47
2.6.1. හැඳින්වීම 47
2.6.2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්තුමය ප්‍රගතිය 48 - 52
2.6.3. මූල්‍ය ප්‍රගතිය 52

# 01. මහජන ආරක්ෂක අමාත්‍යාංශය

## 1.1. හැඳින්වීම

2020.11.20 දිනැති අංක 2202 /25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් එතෙක් අභ්‍යන්තර ආරක්ෂක අංශය ලෙස පැවති විෂය පථය සංශෝධනය කර කැබිනට් අමාත්‍යාංශයක් ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවනු ලැබීය. එදින සිට අවස්ථා කිහිපයකදී අමාත්‍යාංශයීය විෂය පථය සංශෝධනය විය. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව 2023 වර්ෂයට සකස් කරන ලද සැලසුම්වලට අනුව මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගනිමින් රට තුළ සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමත් පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීමත්, දේශීය හා විදේශීය පුද්ගලයන් සඳහා ආගාමික හා විගාමික කාර්යයන් සඳහා පහසුකම් සැලසීමත්, ජාතික ආර්ථිකයට ශක්තියක් වන ලෙසට රටතුල ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ජාලය නියාමනය කිරීමත්, මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම ද ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මගින් සිදු කෙරේ.

ඒ අනුව මහජන ආරක්ෂක අමාත්‍යාංශයට පැවරුණු ප්‍රධාන වගකීම් වන පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම, පුරවැසි අනන්‍යතාවය, දේශීයව හා විදේශීයව සහතික කිරීම, මත්ද්‍රව්‍ය උවදුර හා අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩපැවැත්වීම සහ රටතුල ක්‍රියාත්මක ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍ය ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක කරවීම තුලින් නීති ගරුක පුරවැසියන්ගෙන් යුත් සමාජයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සම්පාදනය කරදෙනු ලබන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්ට අනුව ක්‍රියා කිරීමට සියළු ආයතන කටයුතු කරමින් සිටි.

විශේෂයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය මේ වන විට දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්ගේ නොවිසඳී පැවති උසස්වීමේ හා පුහුණු කිරීමේ ගැටලු විසඳීමටද ඔවුන් සඳහා තාක්ෂණික හා යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදීමටද සුවිශේෂී අවධානයක් යොමුකරමින් කටයුතු සම්පාදනය කරමින් සිටින අතර ඒ තුළින් මහජන හිතකාමී සේවාවක් ශ්‍රී ලංකා පොලීසිය තුළින් ගොඩනැගීමට අපේක්ෂා කරනු ලැබේ.

සමස්තයක් ලෙස සලකා බැලීමේදී මහජන ආරක්ෂාව සුරක්ෂිත කිරීමට හා පුද්ගල අනන්‍යතාවය සහතික කරන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගැනීම පිණිස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියළු ආයතන කටයුතු කරනු ලබමින් සිටී. ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරමින් හා ක්‍රියාත්මක කිරීම් විධිමත් කරමින් අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කරමින් රටේ සංවර්ධන කාර්යයට සහාය දැක්වීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා අමාත්‍යාංශ විෂය පථයට අදාලව ප්‍රතිපත්ති සැකසීම, මඟපෙන්වීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු ඉටුකරනු ලබයි.

**දැක්ම**

" පුරවැසි අනන්‍යතාවය තහවුරු කල ආරක්ෂිත, සුරක්ෂිත, සාමකාමී සහ මත්ද්‍රව්‍යයෙන් තොර ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම"

**මෙහෙවර**

"අපරාධ ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය උවදුර තුරන්කර නීතිය හා සාමය සුරැකි නීත්‍යානුකූල පුරවැසියන්ගේ අනන්‍යතාවය තහවුරු කරන රටක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කිරීම"

**පරමාර්ථය**

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාධනය කරගැනීමේ අභිලාසයද සහිතව රජයේ ප්‍රතිපත්තීන් මත පිහිටා මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අදාළ සුවිශේෂී ප්‍රමුඛ කාර්යයන් ඉටු කරමින් මහජන හිතකාමී සේවාවක් ලබාදීම.

**අරමුණු**

- සියලුම රටවැසියන්ගේ ආරක්ෂාව සහ අනන්‍යතාවය තහවුරු කර ජීවත්වීමට සුදුසු පරිසරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මගපෙන්වීම.

- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට නවීන තොරතුරු තාක්ෂණික උපාංග හා පුහුණුව ලබාදීම මඟින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීයමයභාවය ඉහළනැංවීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි අන්තවාදය, ත්‍රස්තවාදී කටයුතු, මංකොල්ලකෑම්, මිනීමැරුම්, පාතාල ක්‍රියා, මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අංශය හා ක්‍රියාකාරී කොට්ඨාශ ශක්තිමත් කර පවත්වාගෙනයාම.

- ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනයට, අදාල සැලසුම් සකස්කර එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙනයාම.

- රථවාහන භාවිතය මඟින් සිදුවන අනතුරු, ආබාධිත තත්ත්වයන්, මරණ අවම කරගැනීම උදෙසා රථවාහන හැසිරවීම, පාලනය හා නියාමනයට නවීන තාක්ෂණික යෙදවුම් හා භාවිතයන් හඳුන්වාදීම.

- පුද්ගල අනන්‍යතාවය අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව දේශීයව හා විදේශීව තහවුරු කිරීමට පසුබිම සැකසීම.

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**සුවිශේෂී ප්‍රමුඛතා**

- මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.

- සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙල ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.

- අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්දනය කිරීම හා මැඩපැවැත්වීම.

- රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සෑම විටම පවත්වාගෙන යෑම.

- රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවෙන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරුවලින් සිදුවන මරණ, ආබාධ, රෝහල් ගත වීම් වළක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම්, මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම හා මග දෙපස රථ වාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවමකර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලීසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවීකරණය කිරීම.

- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථාව සැලසීම.

- ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම

- පුද්ගල අනන්‍යතාවය දේශීයව තහවුරු කිරීමට සහතිකවන පසුබිම සැකසීම නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.2. අමාත්‍යාංශයේ කාර්තුමය ප්‍රගතිය

- **මානව සම්පත් සංවර්ධනය...**

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් වීමත් සමඟ 2023.04.01 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 329 ක කාර්යය මණ්ඩලයක් අනුමත කරන ලදි. ඒ අනුව සංවර්ධන නිලධාරින් 236 ක් අනුමත කර දී ඇති අතර ඉන් සංවර්ධන නිලධාරින් 196 ක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත අනුයුක්ත කිරීම පිණිස අනුමත කර දී ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය 133 ක් වන අතර සමස්ත කාර්යය මණ්ඩල අවශ්‍යතාවයෙන් 95% ක් 2023 වර්ෂයේ තුන්වන කාර්තුව අවසාන වන විට සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර අමාත්‍යාංශයේ කාර්යභාරය හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් පවත්වා ගෙන යනු ලබයි.

- **පුහුණු පාඨමාලාවලට සම්බන්ධ කිරීම්...**

අමාත්‍යාංශයේ පොදු දැක්ම ළඟා කරගැනීමට හැකිවන සේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය දැනුම. ආකල්ප හා කුසලතා  සංවර්ධනයට පුහුණුවීම් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව දැනුම, ආකල්ප, නිපුණතා හා ධනාත්මක චින්තනය සංවර්ධනය උදෙසා අමාත්‍යාංශ නිලධාරීන් විවිධ පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ කරන ලදී. අමාත්‍යාංශ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා දේශීය වශයෙන් පුහුණුව ලබා දෙන ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් මාණ්ඩලික නිලධාරීන් 03 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා ලබා දී ඇති අතර සෙසු නිලධාරීන් 09 දෙනෙකු සඳහා ද පුහුණු අවස්ථා ලබා දී ඇත. එමෙන්ම නිලධාරීන් 31 දෙනෙකු දෙමළ භාෂා ප්‍රවීණතා පුහුණුව සඳහා යොමු කර ඇත.

අමාත්‍යාංශ නිලධාරීන් සඳහා විෂයානුගත විදේශීය පුහුණු අවස්ථා හිමිවී නොමැති අතර ඒ සඳහා අවස්ථාව ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

- **විශේෂිත වූ කාර්යයන් විධිමත්ව ඇරඹීම උදෙසා...**

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන කාර්යයන් විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව නෛතික රාමුවක් තුළ සිදුකිරීම සඳහා මානව සම්පත් වර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රසම්පාදනය කටයුතු විධිමත් කිරීම සහ සුභසාධනය ඉහළනැංවීම, ආදී විවිධ කාර්යයන් පාදක කර ගනිමින් සමාලෝචිත කාලය තුළ අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 30 ක් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකා සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා නිර්දේශයන් අනුව අමාත්‍යාංශය හා  ඒ යටතේ ඇති ආයතනවල කාර්යයන් විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ක්‍රියාත්මක මට්ටමේ පවතී.

- **මත් ද්‍රව්‍ය භාවිත රියදුරන් හඳුනා ගැනීමට පරීක්ෂණ කට්ටල...**

මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම හේතුවෙන් දෛනිකව ඉහල යන මාරක රිය අනතුරු නිසා සිදු වන මරණ ගණන හැකිතාක් අවම කර මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම මුළුමනින්ම නවතා දැමීමේ අරමුණින් රියදුරන් ක්ෂණිකව පරීක්ෂාකර මත්ද්‍රව්‍ය භාවිත කර රිය පදවන්නන් හඳුනා ගනිමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ.  මේ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හරහා පරීක්ෂණ කට්ටල ලබා ගැනීමට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලින් රු.මිලියන 10 ක අරමුදල් වෙන්  කර ගත් අතර  එමඟින් මිලදීගත්  පරීක්ෂණ කට්ටල ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය හා එක්ව ශ්‍රී ලංකා පොලිසිය වෙත ලබා දුන් අතර එය තෝරා ගත් ප්‍රදේශයන්හි  අත්හදා බැලීම් කාලසිමාව සාර්ථකව නිමවූ පසු එහි දෙවන අදියර 2023.09.06 දින ශ්‍රී  ලංකා පොලිසිය වෙත සංකේතාත්මකව ලබා දෙන ලදි. මේ වන විට එම පරීක්ෂණ කට්ටල යොදාගෙන ශ්‍රී ලංකා පොලිසිය,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ප්‍රමුඛ අදාළ පාර්ශවයන්ගේ සහාය ඇතිව සාධනීය පරීක්ෂණ කටයුතු සිදු කරමින් සිටී.

- **ශ්‍රී ලංකාව තුළ ළමා අපචාර හා අපයෝජන තුරන් කරමින්...**

ළමා අපචාර හා අපයෝජන වැළැක්වීම සඳහා ස්ථිරසාර විසඳුමක් ලබා දීමේ අරමුණින් ශ්‍රී ලංකා පොලීසිය සහ ළමා අපචාර සම්බන්ධව කටුයතු කරනු ලබන සියලුම ආයතන ඒකාබද්ධ කරමින් යාන්ත්‍රණයක් සකස් කිරීම මෙහි අරමුණ වේ. මේ සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙය වීම යටතේ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ අදාල වෙනත් අංශ සම්බන්ධ කර ගනිමින් ළමා අපචාර මැඩ පැවැත්වීම සම්බන්ධ තීන්දු තීරණ ගනිමින්, හා ඊට අදාළ ක්‍රියාමාර්ගයන් වෙත යොමු වෙමින් පවතී. විශේෂයෙන්ම පාසල් තුළ පවතින පැමිණිලි පෙට්ටිය නිසි ක්‍රමවේදයක් යටතේ පවත්වාගෙන යාමටත්, මෙහි වගකීම ප්‍රජා පොලිස් නිලධාරීන් වෙත ලබා දීමටත්, 1929 ක්ෂණික ඇමතුම් සේවය පාසල් මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහාත් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අදාළ කටයුතු සිදු කරමින් පවතී.

- **මතු පරපුර මත් උවදුරෙන් මුදවා ගැනීම පිණිස...**

රටතුල ඉතාමත් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීමට හා විශේෂයෙන් එයට ඇබ්බැහි වන තරුණ පරපුර හා පාසල් සිසුන් එම උවදුරින් මුදවා ගැනීම සඳහා නව රජයේ ප්‍රතිපත්ති වලට අනුකුල වෙමින් විසඳුමක් ලබා දීම මෙහි අරමුණය. ඒ සඳහා යෝග්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමඟ ඒකාබද්ධව නිරන්තරව විවිධ ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී. විශේෂයෙන්ම මේ සඳහා නිලධාරීන් පුහුණු කිරීමත්, පාසල් ළමුන් හා තරුණ ප්‍රජාව සඳහා විධිමත් උපදේශණ වැඩසටහන් පැවැත්වීමටත් කටයුතු සිදු කරමින් පවතී.

- **නියෝජ්‍ය පොලිස්පති කොට්ඨාශ සීමා නිර්ණය කිරීම...**

පරිපාලන දිස්ත්‍රික් හා පළාත් මායිම් නියෝජ්‍ය පොලිස්පති කොට්ඨාස මායිම් සමඟ සමපාත නොවන අවස්ථා හඳුනා ගෙන එම සීමා නිර්ණ ගැටළු සඳහා විසඳුම් සහිත යෝජනාවක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් යුත් කමිටුවක් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලදි. එම කමිටුව විසින් සමපාත නොවන පරිපාලන සීමා සහ පොලිස් බල ප්‍රදේශ සීමා හඳුනා ගෙන ඒ සඳහා විසඳුම් සහිත වාර්තාවක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත. ඒ සඳහා ලද අනුමැතිය අනුව විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් සිටී.

- **ප්‍රජා පොලිස් සංකල්පය අනුව නව පොලිස් ස්ථාන හා මුරකුටි ස්ථාපිත කරමින්...**

විනයගරුක, නීතිගරුක, ගුණගරුක සමාජයක් බිහිකරීම යථාර්තයක් බවට පත් කිරිම සඳහාත්, පොලිස් සේවාවන් වඩා කාර්යක්ෂමව ලබා දීම අරමුණු කර ගනිමිනුත්, ප්‍රජා පොලිස් සංකල්පය නව මුහුණුවරකින් හඳුන්වා දීම සිදු කෙරිණ. 2021 වර්ෂය දක්වා පොලිස් ස්ථාන සංඛ්‍යාව 494 ක් වු අතර නව පොලිස් ස්ථාන 205 ක් හා පොලිස් මුරකුටි 119 ක් ස්ථාපිත කිරීම සඳහා නෛතික අනුමැතිය ලබා ගෙන, එම අනුමැතිය ලද පොලිස් ස්ථාන අතරින් පොලිස් ස්ථාන 113 ක් හා පොලිස් මුරකුටි 29 ක් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට දිවයින පුරා පොලිස් ස්ථාන 607ක් ස්ථාපිත කොට ඇත.

- **ස්ථානීය ක්ෂණික දඩ මුදල් අය කිරීම පිණිස...**

රියදුරු මාර්ග විනය ඇති කිරීම උදෙසා රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය සහ රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදිවලට ක්ෂණික දඩ මුදල් එකතු කිරීමේ පුළුල් ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ අදාල සියලුම ආයතන ඒකාබද්ධව අදියර 03 ක් යටතේ රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/0472/626/004-I හා 2023.04.18 දිනැතිව ලබා දී ඇත. ඒ අනුව අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී.

- **මත්ද්‍රව්‍ය විනාශ කිරීම සම්බන්ධව Incinerator යන්ත්‍රයක් ස්ථාපිත කිරීම...**

අත්අඩංගුවට ගෙන විනාශ කිරීමට අධිකරණ නියෝග ලැබී ඇති මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ ජාතික වශයෙන් ඇති වැදගත් කම සළකා අමාත්‍යාංශය මඟින් ඒ සඳහා මැදිහත්ව කටයුතු කරනු ලබයි. මේ සඳහා යොදා ගනු ලබන යන්ත්‍රය (Incinerator) ස්ථාපිත කිරීමට වනාතවිල්ලුව ලැක්ටොවත්ත ඉඩම තෝරා ගෙන ඇති අතර, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා නාවික හමුදාව, විශේෂ කාර්ය බලකාය යන ආයතන සම්බන්ධ කර ගනිමින් මත්ද්‍රව්‍ය අපහරණය සිදු කිරීමට අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු හා Incinerator යන්ත්‍රය මිලදී ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

- **සේවය හැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවමින්...**

සේවය අතහැර යාමේ නියෝග ලබා සිටි ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ පොලිස් නිලධරයන් 2,297 දෙනා අතරින් නිලධරයන් 1,039 ක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය තුළින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර එයින් සුදුසුකම් ලත් නිලධරයන් 910 ක් සේවයේ යොදවා ඇත. සිව්වන අදියර ලෙස තවත් නිලධාරීන් 62 ක් නැවත සේවයේ පිහිටුවීම නිර්දේශ කරමින් ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **රාජකාරිවලදී මියගිය නිලධාරින්ගේ යැපෙන්නන්ට හා ආබාධිත විශ්‍රාමිකයන්ට සහන සලසමින්...**

නීතිය හා සාමය ආරක්ෂා කිරීම පෙරදැරිව ඉටු කල රාජකාරි අතර තුර මරණයට හෝ පූර්ණකාලිනව ආබාධිත තත්ත්වයට පත් වූ ආරක්ෂක අංශ වල නිලධාරින්ට විශේෂ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත් පොලිස් උපසේවයේ සිටිය දී නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට පෙර පූර්ණකාලිනව ආබාධිත තත්ත්වයට පත් නිලධාරීන් වෙත වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක්වයක් ලබා දීමට ක්‍රියා කරන ලදි. ඒ යටතේ වසර 10ට වැඩි වසර 15ට අඩු සේවා කාලයක් සපුරා ඇති ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතූන් මත සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති නිලධාරින් 05 ක් සඳහාද හිමිකම් ප්‍රදානය කරන ලදි.

එවකට නිත්‍ය පොලිස් සේවයට අන්තර්ග්‍රහණය නොවී ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් හා ස්වභාවික ආපදා මත වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක්වයක් නොලබා මියගිය උපසේවා නිලධාරීන් 34 දෙනෙකුගේ යැපෙන්නන් හට විශ්‍රාම වැටුප් දායකත්ව හිමිකම් ප්‍රදානය කිරීමට 2023.08.09 දින යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය තුළින් අනුමැතිය ලබා ගන්නා ලදි.

- **ශ්‍රී ලංකා පොලිසියේ විශේෂිත දිසාවන්ට හා කොට්ඨාසයන්ට දීමනා ලබා දෙමින්...**

ශ්‍රී ලංකා පොලිසිය මෙරට ආරක්ෂක අංශයේ වඩාත් සුවිශේෂී ආයතනයක් වේ. නීතිය සාමය පවත්වා ගැනීම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම, ප්‍රභූ ආරක්ෂාව, බුද්ධි තොරතුරු ලබා ගැනීම, විමර්ශන සිදුකිරීම, රථ වාහන පාලනය, අපරාධ මර්දනය හා මත්ද්‍රව්‍ය ව්‍යසනය මැඩලීම ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමුඛ කාර්යයන් වේ. එම කාර්යන් අතරින් විශ්‍රාමික ජනාධිපති වරුන්ට ආරක්ෂාව ලභාදෙන ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශය අගමැති ආරක්ෂක කොට්ඨාශය, ඇමති ආරක්ෂක කොට්ඨාශය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා රාජ්‍ය බුද්ධි සේවාව යන දිසා/කොට්ඨාසයන්ට අනුයුක්ත නිලධාරින් වෙත ඔවුන් සිදු කරන සුවිශේෂි කාර්යභාරය වෙනුවෙන් මූලික වැටුපෙන් 1/3ක විශේෂ දීමනාවක් ගෙවීම් කරනු ලබයි. එමෙන්ම අපරාධ විමර්ශන කිරීමේ කාර්යයන්, මත්ද්‍රව්‍ය ජාවරම් මැඩලීමේ කාර්යයන්, මහජන උද්ඝෝෂණ, විරෝධතා හා කැරළි කෝලහාල මර්දනය කිරිමේ කාර්යයන් සහ මෙරට තුළ නීතිය හා සාමය පවත්වා ගැනීම පිණිස බුද්ධි තොරතුරු ලබා ගැනීම හා විමර්ශන සිදු කිරීමේ කාර්යයන් ඉටු කරනු ලබන දිසා හා කොට්ඨාස සඳහා ද ඔවුන් කරනු ලබන සුවිශේෂි කාර්යයන් සලකා මූලික වැටුපෙන් ¼ ක දීමනාවක් ගෙවීම සඳහා 2023.10.02 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටි.

## 1.2.1. මහජන දුක්ගැනවිලි කඩිනමින් සමනය කිරීම පිණිස...

- **118 හදිසි ඇමතුම් සේවාව**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 118 මැදිරියේ මූලික පරමාර්ථය වී ඇත්තේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් හා ත්‍රස්ථ ක්‍රියා සම්බන්ධයෙන් වන තොරතුරු ලබා ගැනීමය. ඊට අමතරව ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි නිලධාරීන්ට විරුද්ධව යොමු වන පැමිණිලි සඳහා කඩිනම් විමර්ශන සිදු කිරීමටත්, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු හා පාතාල ක්‍රියාකාරකම් වැනි තොරතුරු ලබා ගැනීමත් මේ තුළින් සිදු කර ඇත. එමෙන්ම කාලීනව මහජන පැමිණිලි යෝජනා, චෝදනා, දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයත් ශ්‍රී ලංකා පොලීසියත් එක්ව ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කරනු ලැබේ. අමාත්‍යාංශය මෙ 118 දුරකථන අංකය ඔස්සේ පැමිණිලි ක්ෂණිකව ලබා ගත හැකි හදිසි ඇමතුම් සේවාව පැය 24 තුළදීම ක්‍රියාත්මක කෙරේ. ඒ සඳහා ගත වූ මාස 9ක කාලය තුළ පැමිණිලි 70,491 ක් ලැබී ඇති අතර එම සියළුම පැමිණිලි සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. තවද මෙම වර්ෂයේ දී හදිසි ඇමතුම් මැදිරිය තුලින් වඩාත් හොඳ සේවාවක් මහජනතාවට ලබා දීම සඳහා පද්ධතිය යාවත්කාලින කරන ලදී. 118 ජාතික සේවා හදිසි ඇමතුම් හා මහජන පැමිණිලි මැදිරිය නව තාක්ෂණය හා මුසු වෙමින් පැය 24 පුරා ක්‍රියාත්මක ඒකකයක් වන අතර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඍජු අධීක්ෂණය යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ ක්‍රියාත්මකවේ.

- **පොලිස් හා මහජන දුක් ගැනවිලි දින පැවැත්වීමේ ප්‍රගතිය..**

මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම, රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය සඳහා මහජනතාවට අවස්ථාව ලබා දෙමින් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ නිලධාරීන් හා ශ්‍රී ලංකා පොලීසිය ඇතුළු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා එක්ව 2023.01.01. සිට 2023.09.30 දක්වා සෑම බදාදා දිනකම මාර්ගගත ක්‍රමය ඔස්සේ මහජන දින පවත්වා ඇත. එයට පොලිස් නිළධාරින්ගෙන් පැමිණිලි හා අභියාචනා 2,236 ලැබී ඇති අතර සිවිල් පුද්ගලයන් විසින් පැමිණිලි 696 ක් යොමු කර ඇති අතර ඉන් පැමිණිලි 1,113 ක සංඛ්‍යාව සඳහා විසඳුම් ලබා දීමට හැකියාව ලැබී ඇත.

පැමිණිලි 39 ක් සඳහා පැමිණිලි කරුවන් සහභාගී වී නොමැත. පැමිණිලි 314 ක් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප වී ඇත.

### 1.2.2 සංවර්ධන වැඩසටහන් අධීක්ෂණ කටයුතු සිදු කරමින්...

මහජන ආරක්ෂක අමාත්‍යාංශ යටතේ පවතින ආයතන සඳහා වාර්ෂික ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට අදාළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය ලෙස සමාලෝචනය කිරීමේ රැස්වීම් පවත්වන ලදි. විශේෂයෙන්ම ඉදිකිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් ව්‍යාපෘතිවල ගැටලු ඇති වූ අවස්ථාවලදී අදාළ පාර්ශවයන් කැඳවා එම ගැටලු නිරාකරණයට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගනු ලැබිණි. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය මත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අඩාල වූ ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට විධිවිධානද සලස්වන ලදි.
2022 වසරේ අවසන් කාලසීමාවේදී අමාත්‍යාංශයේ විෂය පථය පුලුල් කරමින් නව ආයතන කීපයක් අමාත්‍යාංශයට එක්කිරීම සිදුවිය. ඒ අනුව අමාත්‍යාංශයට අයත් ආයතන සියල්ල කැඳවා ප්‍රගති සමාලෝචනය අමාත්‍යාංශ තුල සිදුකිරීම වෙනුවට අමාත්‍යාංශය ආයතන පරිශ්‍රයන්ට ගොස් ප්‍රගති සමාලෝචනය නව මුහුණුවරකින් සිදු කරන ලදි. එමගින් ආයතනවල ආයතනික කටයුතු නිරීක්ෂණය කිරීමටත් අවස්ථාව ලබාගැනීමට හැකිවිය. මෙම ක්‍රමවේදය වඩාත් ඵලදායී ප්‍රායෝගික වන හෙයින් ඉදිරියටත් ප්‍රගති සමාලෝචනය එම ක්‍රමවේදය ඔස්සේ සිදුකිරීමට තීරණය කරන ලදි.






- **අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලසුම් ක්‍රියාවට නංවමින්....**

  - අභ්‍යන්තර විගණන අංශය මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විගණන විමසුම්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතු අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය විගණන ක්‍රියාමාර්ග ගෙන ඇත. සකස් කල විගණන සැලැස්මට අනුව පළමු, දෙවන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. ඒ අනුව 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙන් 75% ක් ආවරණය කිරීමට තෙවන කාර්තුව වනවිට හැකි වී ඇත.

  - ආයතනික අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් අත්තිකාරම් බී ගිණුම, පොදු තැම්පත් ගිණුම, වත්කම් කළමනාකරණය, ගබඩා පරීක්ෂාව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, භාණ්ඩ අපහරණ, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂාව, පුද්ගලික ලිපි ගොනු නඩත්තුව, නිවාඩු සහ වාහන නඩත්තුව, අමාත්‍යාංශ වෙබ් අඩවිය යන ක්ෂේත්‍ර ඔස්සේ අදාළ කාලය තුළ විගණනයන් සිදුකර එක් එක් අංශ සඳහා විගණන විමසුම බැගින් නිකුත් කර ඇත.

- එමෙන්ම සමාලෝචිත කාලය තුළ විශේෂ කාර්ය බලකායේ ගෙවීම් වවුචර් පරීක්ෂාවන් සිදු කර ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ මූලස්ථාන විගණන පරීක්ෂාවක් හා ගාල්ල පුනරුත්ථාපන මධ්‍යස්ථාන පරීක්ෂාවක්ද සිදු කර ඇත. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය පිළිබඳවත්, මූල්‍ය හා අනෙකුත් අංශවල සිදුවන අක්‍රමිකතා පරීක්ෂා කිරීමටත්, වාර්ෂික සැලසුම්, ප්‍රගති සමාලෝචනය, ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධ එක් විගණන විමසුමක්ද යොමු කිරීමට ක්‍රියාකර ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අදාළව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එක් විගණන විමසුමක්ද යොමු කර ඇත.

## 1.2.3 අන්තර් සහයෝගීතාවය ලබා ගනිමින්...

වර්තමාන මහජන ආරක්ෂක ගරු අමාත්‍යතුමා එම ධූරය භාරගැනීමෙන් පසු ප්‍රථමයෙන්ම ඒ හා බැඳුණු භාරධූර වගකීම හා කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් සාකච්ඡා පවත්වන ලදි. ඒ අතර විදේශ නියෝජිතයින් හා අන්තර් සම්බන්ධීකරණයන් අවශ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදි.

- **ද්විපාර්ශවීය ගිවිසුම් විදේශීය රාජ්‍යයන් සමඟ...**

  ශ්‍රී ලංකා රජය හා විදේශ රාජ්‍යයන් අතර නීතිය බලාත්මක කිරීම, පුහුණු පාඨමාලා, තොරතුරු පහසුකම්, හුවමාරු කර ගැනීම, තාක්ෂණික මෙවලම් හා උපදෙස් ලබා ගැනීම, විදේශ රටවල නීත්‍යානුකූල නොවන අයුරින් රැඳී සිටින පුරවැසියන් ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීම ආදී වූ ක්‍රියාවලීන් සඳහා මෙම අමාත්‍යාංශය මඟින් අවබෝධතා ගිවිසුම් වලට එළඹ ඇත.

- **මිනිස් ජාවාරම් සම්බන්ධ...**

  මිනිස් ජාවාරම තුරන් කිරීමේ දේශීය කාර්යසාධක බලකායේ ප්‍රධානම පාර්ශවකරුවකු වශයෙන් මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක අතර ශ්‍රී ලංකා පොලිසිය මිනිස් ජාවාරම් සමුද්‍රීය අපරාධ විමර්ෂන අංශය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙමින් මිනිස් ජාවාරම පිටු දැකීමට කටයුතු කරනු ලැබේ.

  එමෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන්, ඇමෙරිකානු එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් ඇන්ටනී බ්ලින්කන් මහතාගේ ප්‍රධානත්වයෙන් කෘතීම මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඊශ්‍රායලය, ජර්මනිය, ඉතාලිය, ආජන්ටිනාව, බෙල්ජියම, කැනඩාව, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව, කොරියාව ඇතුළු රටවල් විශාල සංඛ්‍යාවක විෂය භාර අමාත්‍යවරුන් සහ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් මෙම සමුළුවට සහභාගි වූ අතර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ගරු අමාත්‍ය ටිරාන් අලස් මහතා ද සහභාගි විය. කෘතීම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බෙදා හැරීම මර්ධනය කිරීමට ලොව සියලු රටවල් එක්ව කටයුතු කළ යුතුය යන සංකල්පය ඔස්සේ ජාත්‍යන්තර සම්මුතියකට එළඹීම මෙහි අරමුණ විය.



- ශ්‍රී ලංකා රාජතාන්ත්‍රික සබඳතා පිළිබඳව සාකච්ඡා ප්‍රංශ තානාපති ජොංෆ්‍රැන්සුවා පැක්තෙ මහතා හා මහජන ආරක්ෂක ගරු අමාත්‍ය ටිරාන් අලස් මහතා අතර පැවතින. එහිදී තවදුරටත් එම සම්බන්ධතා ශක්තිමත් කරගැනීම සඳහා සිය පූර්ණ සහය ලබා දෙන බව ප්‍රංශ තානාපති ජොංෆ්‍රැන්සුවා පැක්තෙ මහතා ප්‍රකාශ කර ඇත. එහිදී ශ්‍රී ලාංකිකයන් නීති විරෝධී සංක්‍රමණිකයන් ලෙස ප්‍රංශයේ දූපත් වලට ඇතුලුවීම වැලැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවද සාකච්ඡා කරනලදි.

- ශ්‍රී ලංකාවේ ස්විස්ටර්ලන්ත තානාපති ඩොමිනික් ෆර්ග්ලර් මහතා හා ගරු අමාත්‍ය ටිරාන් අලස් මහතා අතර හමුවක් පැවති අතර මෙහිදී ස්විස් තානාපති ඩොමිනික් ෆර්ග්ලර් මහතා ශ්‍රී ලංකා පොලිසිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය සහ පොලිස් නිලධාරීන්ගේ පුහුණුවීම් වැඩමුළු පැවැත්වීමට සහයෝගය ලබාදීමට එකඟතාවය පලකරන ලදි.



තවදුරටත් ස්විස්ටර්ලන්ත තානාපතිවරයා මානව හිමිකම් ආරක්ෂා කිරීමේ වැදගත්කම සහ සත්‍ය කොමිසම පිහිටුවීමේ වැදගත්කම පිළිබඳවද අදහස් හුවමාරු කර ගත් අතර, මහජන ආරක්ෂක ගරු අමාත්‍ය ටිරාන් අලස් මහතා සත්‍ය කොමිසම ඒක පාර්ශ්වික නොවිය යුතු බවට යෝජනා ඉදිරිපත් කර ඇත.



- ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියානු මහ කොමසාරිස් දේවි ගුස්ටිනා ටෝබින්ග් මහත්මිය හා මහජන ආරක්ෂක ඇමැති ටිරාන් අලස් මහතා අතර සුහද හමුවක් පැවති අතර එහිදී, ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර පවතින ද්වී පාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩි දියුණු කිරීම පිළිබඳව අවධානය යොමු විය. තවද ආර්ථික හා දේශපාලනික වශයෙන් දෙරට අතර පවතින සම්බන්ධතා තවදුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා ඉදිරියේදීත් කටයුතු කරන බවත්, අවශ්‍ය සෑම අවස්ථාවකදීම තම රටෙහි සහයෝගය ශ්‍රී ලංකාවට ලබාදීමට මහකොමසාරිස්වරිය එකඟතාවය පලකරන ලදි.



- ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපති දමියානෝ ෆ්රැන්කොවිඟ් මහතා හා මහජන ආරක්ෂක ඇමැති ටිරාන් අලස් මහතා අතර ද්විපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව ගැන සාකච්ඡා පැවැත්වින. එහිදි තවදුරටත් දෙරට අතර සිදුවන අනවසර සංක්‍රමණිකයින් සහ මත්ද්‍රව්‍ය ජාවාරම පාලනය සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඉතාලියේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය එක්ව ගත හැකි ක්‍රියාමාර්ග පිලිබඳව සාකච්ඡා කෙරිණ.

## 1.3. මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය.

**අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය**

සංඛ්‍යා වගුව - 01

| ආයතන | 2023 ප්‍රතිපාදන (රු.) | | 2023.09.30 දක්වා වියදම (රු.) | | වියදම් ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| මහජන ආරක්ෂක අමාත්‍යාංශය ව්‍යාපෘති 1 | 47,400,000.00 | 4,050,000.00 | 28,877,676.48 | 2,820,740.00 | 61% | 70% |
| මහජන ආරක්ෂක අමාත්‍යාංශය ව්‍යාපෘති 2 | 278,100,000.00 | 3,950,000.00 | 203,289,381.61 | 1,955,351.21 | 73% | 50% |

## 1.4. අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

- පොලිස් මූලස්ථානය අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් සුදුසු ස්ථානයක ස්ථාපනය කිරීමට සහ ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය ගොඩනැගිලි, භෞතික හා මානව සම්පත් ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, අදාල කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම.
- පොලිස් නිලධාරීන්ගේ උසස්වීම්, ස්ථානමාරුවීම් සහ විනය සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබාදීම කාර්යක්ෂම කිරීම හා අවශ්‍ය මානව සම්පත ලබාදීම.
- රිය අනතුරු අවම කරලීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ රථවාහන කොට්ඨාසය නව තාක්ෂණයෙන් ශක්තිමත් කිරීමට පියවරගැනීම.
- අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව විදේශ ගමන් බලපත්‍ර සකස් කිරීම, වීසා හා පුරවැසිභාවය නිකුත් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සවිබලගැන්වීම.
- ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම්පතක් නිකුත්කිරීමට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සවිබලගැන්වීම.
- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සවිබලගැන්වීම.
- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ශක්තිමත් ආයතනයක් බවට පත්කර ඒ තුලින් ජාතික ආර්ථික සංවර්ධනයට ඉහළ දායකත්වයක් ලබාගැනීම.

# 02. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

i. ශ්‍රී ලංකා පොලිසිය
ii. විශේෂ කාර්ය බලකාය
iii. ආගමන විගමන දෙපාර්තමේන්තුව
iv. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
v. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
vi. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

## 2.1. ශ්‍රී ලංකා පොලිසිය

### 2.1.1. හැඳින්වීම

1865 අංක 16 දරණ පොලිස් ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේදී මහජනතාවට සංවිධානාත්මක සේවාවක් ලබා දීමේ අරමුණින් පොලිස් දෙපාර්තමේන්තුව 1866 සැප්තැම්බර් මස 03 වන දින ආරම්භ කරන ලදි. එදා සිට මේ දක්වා වසර 156 කට අධික කාලයක් ශ්‍රී ලංකා පොලිසිය "රටේ නීතිය හා සාමය" සුරක්ෂිත කොට පවත්වාගෙන යාමේ භාරධූර වගකීම ඉටු කරමින් සිටී.

ජන ජීවිතයේ සෑම අංශයකම ආරක්ෂාව සහතික කරමින් සමාජ සුරක්ෂිත භාවය තහවුරු කිරීමේ පෘථුල වගකීම ශ්‍රී ලංකා පොලිසිය වෙත පැවරී ඇත. සමාජ සාමය සහ යහපැවැත්ම සඳහා පාදක වන අපරාධ මර්දනය හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්දනය, රථවාහන පාලනය, පරිසර ආරක්ෂණය, ආපදා අවස්ථාවන්හි ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්ෂාව යන ප්‍රධාන කාර්යය භාරයන් පොලීසියේ විෂය පථයට අදාළ වේ.

ඉහත කාර්යය භාර්යයන් මුළු දිවයින පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා දවසේ පැය 24 පුරාම රාජකාරියෙහි නියැළෙන අධීක්ෂණ ශ්‍රේණිය, පරීක්ෂක ශ්‍රේණිය සහ කණිෂ්ඨ යන ශ්‍රේණීන්ගෙන් සැදුම්ලත් 90,000 කට අධික පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටී. මෙම නිලධාරීන් සාමාන්‍ය සේවය, සහායක සේවය සහ විශේෂ කාර්ය බලකාය ලෙස සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. මීට අමතරව 4000 කට අධික සිවිල් නිලධාරීන් සංඛ්‍යාවක් ද ශ්‍රී ලංකා පොලීසියේ කාර්යයන් සඳහා සහාය දක්වමින් රාජකාරි කරනු ලබයි.

වසර 156 ක ඓතිහාසික මෙහෙවරක යෙදී සිටින ශ්‍රී ලංකා පොලීසිය අද වන විට වඩාත් පෘථුල කාර්යය භාරයක් ඉටු කිරීම සඳහා මහජනතාවට වඩාත් සමීප වෙමින් දිවයින පුරා පොලිස් ස්ථාන 607 කට අධික සංඛ්‍යාවක් පිහිටුවා ඇත. ඊට අමතරව ප්‍රාදේශීය කොට්ඨාස 45 ක් සහ ක්‍රියාකාරී කොට්ඨාස 81 කින් සමන්විත සංවිධානාත්මක ආයතන ව්‍යුහයක් මඟින් ශ්‍රී ලංකා පොලීසියේ සේවාවන් ක්‍රියාත්මක වේ.

## 2.1.2. ශ්‍රී ලංකා පොලීසියේ කාර්තුමය ප්‍රගතිය

"රටේ නීතිය හා සාමය" සුරක්ෂිත කොට පවත්වා ගෙන යමින්, සමාජ සාමය සහ යහපැවැත්ම සඳහා පාදක වන අපරාධ මර්ධනය හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්ධනය, රථවාහන පාලනය, පරිසර ආරක්‍ෂණය, ආපදා අවස්ථාවන්හිදී ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්‍ෂාව යන ප්‍රධාන කාර්යභාරයන් පොලීසියේ විෂය පථයට අදාළ වේ. මීට අමතරව නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම මෙන්ම මහජනයාට ඉතා සමීපව සම්බන්ධ වන 119 හදිසි ඇමතුම් සේවාව ඔස්සේ මහජන පැමිණිලි වලට ක්‍ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ සේවාව ක්‍රියාත්මක වන අතර එමගින් ජනතාව වෙත පොලීසියේ සේවාවන් ඉතා ඉක්මණින් සමීප කරවීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

ඒ අනුව සියළු පොලිස් ස්ථාන, මූලස්ථාන පොලිස් ස්ථාන හා සාමන්‍ය පොලිස් ස්ථාන ලෙස වර්ගකොට සෑම පොලිස් ස්ථානයක්ම විවිධ මට්ටම් යටතේ ශ්‍රේණිගත කර ඇත. ඒ අනුව A1 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 82 ක්ද A2 ශ්‍රේණියට අයත් 103 ක්ද A3 ශ්‍රේණියට අයත් 142 ක්ද B ශ්‍රේණියේ පොලිස් ස්ථාන 152 ක් ද C ශ්‍රේණියේ පොලිස් ස්ථාන 74ක් ද සහ D ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 54 ක් ද ලෙස 2023.09.30 දිනට පොලිස් ස්ථාන 607 ශ්‍රේණිගත කර ඇත. මූලස්ථාන පොලිස් ස්ථානයක් භාරව ප්‍රධාන පොලිස් පරීක්‍ෂක වරයෙකු සහ අනෙකුත් පොලිස් ස්ථාන භාරව ස්ථානාධිපතිවරයෙකු පත් කොට ඇති අතර ඔවුන් විසින් තමන් යටතේ සේවය කරන පොලිස් පරීක්‍ෂකවරුන්, පොලිස් සැරයන්වරුන් සහ පොලිස් කොස්තාපල්වරුන් මගින් සෘජුවම මහජනතාව වෙත පොලීසියේ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

පොලිස් රාජකාරී සඳහා අවශ්‍ය විවිධ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා සහායක සේවාවක්ද ක්‍රියාත්මකව පවතින අතර ඒ යටතේ වෛද්‍ය, හෙද, ඉංජිනේරු, සූපවේදී, කාර්මික, තොරතුරු තාක්‍ෂණ වැනි විශේෂිත සේවාවන් සඳහා 1291 කට ආසන්න නිලධාරීන් සංඛ්‍යාවක් සුවිශේෂී රාජකාරියක නියැලී සිටී. මීට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සහ, රජයේ විවිධ සේවාවන්ට අයත් පරිපාලන නිලධාරීන්, භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරි, කාර්යාල කාර්ය සහායක වැනි දෙපාර්තමේන්තු ගත නොවන තනතුරු වලට අයත් නිලධරීන් සහ අපරාධ විද්‍යාඥ, පර්යේෂණ නිලධාරි, සංවර්ධන සහකාර නිලධාරි සහ විවිධ කම්කරු වෘත්තීන්ට අයත් දෙපාර්තුමේන්තුගත නිලධාරින්ද ඇතුළත් සිවිල් කාර්ය මණ්ඩල නිලධරීන් 4000 කට අධික පිරිසක් පොලිස් රාජකාරි සඳහා සුවිශේෂී සහයක් ලබා දෙමින් සේවයේ යෙදී සිටී. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය සතු මානව හා භෞතික සම්පත් සියල්ල යොදා ගනිමින් සුවිශේෂි කාර්ය භාර්යයක් ඉටු කරනු ලබයි. ඒ තුළින් අත් කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

- **අපරාධ වාර්තාවීම් හා විසඳීම්**

ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. 2022-2023 මුල් කාර්තු තුන තුළ අපරාධ වාර්තාවීම් ප්‍රමාණය හා අපරාධ විසඳීම් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

**සංඛ්‍යා වගුව - 02**

| අපරාධ වර්ගය | 2022.01.01 සිට 2022.09.30 දක්වා | | 2023.01.01 සිට 2023.09.30 දක්වා | |
|---|---|---|---|---|
| | වාර්තාවීම | විසඳීම | වාර්තාවීම | විසඳීම |
| බල අපරාධ | 26,898 | 19,979 | 33,621 | 23,393 |
| සුළු පැමිණිලි | 672,926 | 617,173 | 639,541 | 589,877 |

| | | | | |
|---|---|---|---|---|
| සුළු වැරදි පුද්ගලයින්ට එරෙහි | 33,766 | 28,527 | 27,778 | 21,090 |
| සුළු වැරදි දේපලවලට එරෙහි | 39,051 | 21,342 | 38,007 | 19,640 |
| ව්‍යවස්ථාපිත වැරදි | 13,516 | 12,416 | 18,076 | 15,879 |
| **එකතුව** | **786,157** | **699,437** | **757,023** | **669,879** |

ඉහත වගුවෙන් බල අපරාධ විසඳීම් ලෙස දක්වනුයේ වාර්තා වූ බල අපරාධ වලට අදාලව සැකකරු අත් අඩංගුවට ගැනීම සිදු කර ඇති ප්‍රමාණය වේ. ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමු කොට හෝ නඩු පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ සුළු පැමිණිලි සහ සුළු වැරදි ඒ යටතේ වන විසඳීම් ලෙස පෙන්නුම් කර තිබේ.

- **කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ**

ජනසමාජයක කාන්තාවන් හා ළමයින් සුවිශේෂී භූමිකාවක් නිරූපනය කරනු ලබයි. එබැවින් අපරාධ හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සමාජයක් නිර්මාණය කිරීමේදී කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ වැළැක්වීමට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. 2022-2023 මුල් කාර්තු තුන තුළ වාර්තා වූ සහ විසඳූ කාන්තා හා ළමා අපරාධ වල ප්‍රගතිය පහත සංඛ්‍යා වගුව මඟින් පෙන්නුම් කරනු ලබයි.

**සංඛ්‍යා වගුව - 03**

| අපරාධ වර්ගය | 2022.01.01 සිට 2022.09.30 දක්වා | | 2023.01.01 සිට 2023.09.30 දක්වා | |
|---|---|---|---|---|
| | වාර්තාවීම | විසඳීම | වාර්තාවීම | විසඳීම |
| ළමයින්ට එරෙහි අපරාධ | 3,935 | 3,724 | 3,817 | 3,651 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 4,972 | 4,624 | 5,304 | 4,621 |
| **එකතුව** | **8,907** | **8,348** | **9,121** | **8,273** |

- **රථවාහන අනතුරු ප්‍රමාණය**

රථවාහන ගමනාගමනය පාලනය කිරීම නීතිය හා සාමය ආරක්ෂා කිරීමේදී ශ්‍රී ලංකා පොලීසියට පැවරෙන ප්‍රධාන කාර්යයකි. 2022-2023 මුල් කාර්තු තුන තුළ මුළු රථ වාහන අනතුරු ප්‍රමාණය පහත සංඛ්‍යා වගුව මඟින් පෙන්නුම් කරනු ලබයි.

**සංඛ්‍යා වගුව - 04**

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ | මියගිය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 2022.01.01 සිට 2022.09.30 දක්වා | 1,820 | 4,722 | 6,082 | 3,722 | 1,989 |
| 2023.01.01 සිට 2023.09.30 දක්වා | 1,612 | 5,041 | 7,091 | 4,886 | 1,722 |

- **මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ**

ශ්‍රී ලංකා පොලීසියේ මත්ද්‍රව්‍ය නාශක කොට්ඨාශය, සියළුම ප්‍රාදේශීය කොට්ඨාශ, විශේෂ කාර්ය බලකාය සහ සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල කැපවීම සහ විමර්ශන වල ප්‍රතිඵලයක් ලෙස 2022-2023 මුල් කාර්තු තුන තුළ වාර්තා වූ සුරාබදු හා නිද්‍රාජනක වැරදි විසඳීම් පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව - 05

| අපරාධ වර්ගය | 2022.01.01 සිට 2022.09.30 දක්වා | | 2023.01.01 සිට 2023.09.30 දක්වා | |
|---|---|---|---|---|
| | වාර්තාවීම | විසඳීම | වාර්තාවීම | විසඳීම |
| සුරාබදු වැරදි | 51,185 | 46,069 | 162,573 | 147,022 |
| නිද්‍රාජනක වැරදි | 45,715 | 41,274 | 131,352 | 117,676 |
| **එකතුව** | **96,900** | **87,343** | **293,925** | **264,698** |

- **දූෂණ වැරදි**

දූෂණ වැරදි යටතේ වෛශ්‍යා වෘත්තිය, ගණිකා නිවාස පවත්වාගෙන යාම, සමලිංගික සම්බන්ධතා වැනි කාණ්ඩ 06 ක් වර්ග කෙරේ. 2022-2023 මුල් කාර්තු තුන තුළ මුළු දූෂණ වැරදි පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව - 06

| අපරාධ වර්ගය | 2022.01.01. සිට 2022.09.30 දක්වා | | 2023.01.01. සිට 2023.09.30 දක්වා | |
|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| දූෂණ වැරදි | 441 | 375 | 946 | 777 |

- **දඩ මුදල් මඟින් උපයන ලද ආදායම**

ශ්‍රී ලංකා පොලීසිය මඟින් උසාවි දඩ මුදල්, රථ වාහන වැරදි සහ රිය අනතුරු සම්බන්ධ නඩු පැවරීම් මඟින් 2022-2023 මුල් කාර්තු තුන තුළ එක් එක් ආදායම් මූලාශ්‍රය මඟින් ඉපැයූ දඩ මුදල් ප්‍රමාණය 07 වන සංඛ්‍යා වගුව මඟින් දැක්වේ.

සංඛ්‍යා වගුව - 07

| ආදායම් මූලාශ්‍රය | 2022.01.01. සිට 2022.09.30 දක්වා (රු.) | 2023.01.01. සිට 2023.09.30 දක්වා (රු.) |
|---|---|---|
| දඩපත් ගෙවීම් | 835,807,090.00 | 1,497,101,511.00 |
| රථවාහන හා වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම | 723,739,650.00 | 2,570,206,779.00 |
| රිය අනතුරු සම්බන්ධයෙන් නඩු පැවරීම් | 91,884,720.00 | 210,307,050.00 |
| **එකතුව** | **1,651,431,460.00** | **4,277,615,340.00** |

- **මහජන දුක්ගැනවිලි කළමනාකරණය**

මහජන දුක්ගැනවිලි කළමනාකරණය සඳහා මහජන සහන මැදිරිය, පොලිස්පති මහජන සහන දිනය, 119 දුරකථන මැදිරිය, පොලිස්පතිට කියන්න මෙහෙයුම් මැදිරිය යන විවිධ කළමනාකරණ ක්‍රමවේද ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ 119 මැදිරිය සඳහා සමාලෝචිත කාලය තුළ වාර්තා වී ඇති පණිවුඩ ප්‍රමාණය.

සංඛ්‍යා වගුව - 08

| කළමනාකරණ ක්‍රමවේදය | 2023.01.01. සිට 2023.09.30 දක්වා | | |
|---|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි සංඛ්‍යාව |
| මහජන සහන මැදිරිය | 1825 | 559 | 1126 |
| මහජන අභියාචනා | 39 | 30 | 09 |
| පොලිස්පති මහජන සහන දිනය | 2745 | 2745 | - |

- **බඳවා ගැනීම්**

2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකා පොලීසිය සඳහා නව බඳවා ගැනීම් කිසිවක් සිදු කර නොමැත.

- **උසස් කිරීම්**

ශ්‍රී ලංකා පොලීසියේ නිල ධුරාවලින් අනුව සුදුසුකම් ලැබූ නිලධාරීන් 8381 දෙනෙකුට 2023 මුල් කාර්තු තුන තුළ උසස්වීම් ලබා දී තිබේ. ඒ අතරින් වැඩිම නිලධාරීන් ප්‍රමාණයක් උසස්වීම් ලැබ ඇත්තේ පොලිස් කොස්තාපල් නිලයේ සිට පොලිස් සැරයන් නිලය දක්වා වේ. එසේ උසස්වීම් ලැබූ නිලධාරීන් ප්‍රමාණය 4587 කි. එක් එක් නිලයන් අනුව උසස්වීම් ලැබූ නිලධාරීන් ප්‍රමාණය පහත වගුව මඟින් ඉදිරිපත් කෙරේ.

සංඛ්‍යා වගුව - 09

| උසස්වීම් ලබා දීම | | නිලධාරීන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| කලින් දැරූ තනතුර | උසස්වීම් ලද තනතුර | සාමාන්‍ය සේවය | වි.කා.බ | සහායක සේවය |
| නි.පොලිස්පති | ජ්‍යෙ.නි. පොලිස්පති | 2 | - | - |
| පොලිස් අධිකාරී | ජ්‍යෙ. පොලිස් අධිකාරී | 37 | | 1 |
| සහකාර පොලිස් අධිකාරී | පොලිස් අධිකාරී | 33 | 8 | - |
| කාන්තා සහකාර පොලිස් අධිකාරී | කාන්තා පොලිස් අධිකාරී | - | - | - |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | සහකාර පොලිස් අධිකාරී | 13 | - | - |
| කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | කාන්තා සහකාර පොලිස් අධිකාරී | - | - | - |
| පොලිස් පරීක්ෂක | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 18 | 3 | 8 |
| කාන්තා පොලිස් පරීක්ෂක | කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | 2 | | 1 |
| උප පොලිස් පරීක්ෂක | පොලිස් පරීක්ෂක | 224 | 50 | 42 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක | කාන්තා පොලිස් පරීක්ෂක | - | - | 5 |
| පොලිස් සැරයන් | උප පොලිස් පරීක්ෂක | 1512 | 114 | 2 |
| කාන්තා පොලිස් සැරයන් | කාන්තා උප පොලිස් පරීක්ෂක | 595 | | 6 |
| පොලිස් සැරයන් රියදුරු | උප පොලිස් පරීක්ෂක/ ප්‍රවාහන | 5 | 11 | - |
| පොලිස් කොස්තාපල් | පොලිස් සැරයන් | 4587 | 493 | 90 |
| කාන්තා පොලිස් කොස්තාපල් | කාන්තා පොලිස් සැරයන් | 405 | | 3 |
| පොලිස් කොස්තාපල් රියදුරු | පොලිස් සැරයන් රියදුරු | 104 | 7 | - |
| **එකතුව** | | **7537** | **686** | **158** |

- **පොලිස් නිලධාරීන්ගේ සේවය ඇගයීම**

විශිෂ්ඨ සේවාව සහ ඇගයීම් කරුණු පාදක කර ගනිමින් 2023 වර්ෂයේ මුල් කාර්තු තුන තුළ පොලිස් නිලධාරීන් 8450 දෙනෙකුට පහත සඳහන් පදක්කම්, සම්මාන හා දීමනා පිරිනැමීම සඳහා ගැසට් ගත කිරීමට යොමු කර ඇත.

**සංඛ්‍යා වගුව - 10**

| අනු අංකය | පදක්කම/ ලාංඡනය/ දීමනාව | ගැසට් ගත කිරීම සඳහා යොමුකල නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පොලිස් විශිෂ්ඨ සේවා පදක්කම | 281 |
| 02 | දීර්ග සේවා හා යහපත් කල්ක්‍රියා පදක්කම | - |
| 03 | යහපත් සේවා දීමනාව | 226 |
| 04 | මානුෂීය මෙහෙයුම් පදක්කම හා සාන්දාරය | - |
| 05 | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පදක්කම | 10 |
| 06 | යහපත් කල්ක්‍රියා ලාංඡනය | 4194 |
| 07 | දේශපුත්‍ර සම්මානය හා පූර්ණභූමි පදක්කම | 3738 |
| 08 | රිවිරැස මෙහෙයුම් පදක්කම | 01 |

- **සුභසාධන කටයුතු**

නාරාහේන්පිට හා කුන්ඩසාලේ පිහිටා ඇති පොලිස් රෝහල් මගින් ශ්‍රී ලංකා පොලීසියේ සේවයේ නියුතු නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට හා විශ්‍රාම ගිය නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට වෛද්‍ය ප්‍රතිකාර කිරීම සිදු කරනු ලබයි.

2023 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා සායන 16,911 ක් පවත්වා ඇත. බාහිර රෝගී අංශයෙන් 7391 ක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇති අතර නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් ගණන 418 දෙනෙකි. සමාලෝචිත කාලය තුළ පොලිස් රෝහලට අවශ්‍ය ඖෂධ හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට රු.1,205,538,306.77 ක් වැය කර ඇත.

- **ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම**

ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්ත වාහන වලින් 50%ක් වසර 10කට වඩා වැඩි බැවින් ඉන්දියානු ණය අධාර යටතේ ජීප් රථ 750ක් මිලදී ගැනීමට ක්‍රියා කරන ලදි. 2022 ජනවාරි 11 දින එළඹි අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2022 හා 2023 යන වර්ෂ වලදී ජීප් රථ 750ක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා අනුමැතිය හිමි වී ඇත.



ඒ අනුව ජීප් රථ 125ක් 2022 වසර තුල හා තවත් ජීප් රථ 375ක් 2023 වසර තුල ලෙස ජීප් රථ 500ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා පොලිසිය වෙත ලබා ගැනීමට කටයුතු කරන ලදී.

- **2024, 2025 හා 2026 වර්ෂවලදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති**

  - උතුරු පළාත් පොලිස් ස්ථාන සඳහා ඉන්දියානු ප්‍රදානයන් යටතේ රු. මිලියන 300ක මුදලින් සිංගල් කැබ් රථ මිලදී ගැනීම
  - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ක්‍රමවේදය JICS යටතේ වාහන වර්ග 09ක් යටතේ වාහන 384 ක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
  - ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීමට අපේක්ෂිත වාහන හා අමතර කොටස් යටතේ ස්කොර්පියෝ ජීප් රථ අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් හා වාහන වර්ග හයක් යටතේ වාහන 114 ක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

### 2.1.3. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

- **ගොඩනැගිලි සංවර්ධනය**

ශ්‍රී ලංකා පොලීසියේ පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල, භට නිවාස, පුහුණු මධ්‍යස්ථාන ඇතුළු පොදු ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කරනු ලැබේ. ඒ අනුව 2023 වර්ෂයට ව්‍යාපෘති 26 ක් සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 800 කි. ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර ගන්නා ලද රු.මි 800 ක ප්‍රතිපාදනයෙන් මුල් කාර්තු තුන අවසන් වන විට දරා ඇති වියදම රු.මි 115.7 කි.



මුලතිව් පොලිස් ස්ථානය ඉදිකිරීම



නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීම

පොලිස් නිලධාරීන් වෘත්තිමය වශයෙන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ කටාන පොලිස් අභ්‍යාස ආයතනය සහ කළුතර පොලිස් විද්‍යාලයේ සංවර්ධන කටයුතු සිදු කෙරේ.



2023 වර්ෂයේ කටාන පොලිස් අභ්‍යාස ආයතනය සංවර්ධනය සඳහා රු.මි. 60 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර 2023 වර්ෂයේ මුල් කාර්තු තුන අවසන් වන විට දරන ලද වියදම රු.මි 12.73 කි.

## 2.1.4. 2023 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති

සංඛ්‍යා වගුව - 11

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2023/09/30 දිනට ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|
| 1 | යාපනය පොලිස් ස්ථානය ඉදි කිරීම | 8.00 | - |
| 2 | පේදුරුතුඩුව පොලිස් ස්ථානය ඉදි කිරීම | 10.00 | - |
| 3 | මරදාන තනිකඩ භට නිවාසය ඉදිකිරීම | 45.00 | - |
| 4 | වෙරළබඩ විවහක නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම | 4.82 | 4.82 |
| 5 | බද්දේගම පොලිස් ස්ථානය ඉදිකිරීම (DOB) | 5.45 | 5.45 |
| 6 | පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම - STC | 23.00 | 12.97 |
| 7 | පොල්පිතිගම පොලිස් ස්ථානය ඉදිකිරීම | 15.00 | 12.71 |
| 8 | බද්දේගම ස්ථානාධිපති නිළ නිවස ඉදිකිරීම | 2.15 | 1.05 |
| 9 | කටාන ස්ථානාධිපති නිල නිවස ඉදිකිරීම | 4.70 | |
| 10 | කුමාර රත්නම් මාවත විවාහක නිළ නිවාස සංකීර්ණය ඉදිකිරීම | 113.42 | 47.42 |
| 11 | මිරිහාන භට නිවාසය ඉදිකිරීම (DOB) | 10.00 | 1.75 |
| 12 | කුරුදුවත්ත පොලිස් ස්ථානයේ භට නිවාසය ඉදිකිරීම | - | |
| 13 | තිරුක්කෝවිල් පොලිස් ස්ථානය ඉදිකිරීම | 5.00 | |
| 14 | නාරාහේන්පිට පොලිස් ස්ථානයේ 3,4,5 හා 6 මහල්වල ජල නල පද්ධතිය සහ නාන කාමර වල පවතින අඩු පාඩු සකස් කිරීම | 35.00 | 5.00 |
| 15 | පොලිස් සුභසාධක ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය | 8.00 | - |
| 16 | වනාතවිල්ලුව මත්ද්‍රව්‍ය විනාශකිරීමේ ගොඩනැගිල්ල ඉදිකිරීම | 5.19 | 4.19 |
| 17 | ප්‍රවාහන කොට්ඨාසයේ ට්‍රාන්ස්ෆෝමර් කාමරයක් ඉදිකිරීම | 2.00 | -- |
| 18 | පොලිස්පති නිල නිවසේ රාජකාරි නියතු නිලධාරීන් සඳහා භට නිවාසයක් ඉදිකිරීම | 9.27 | 9.27 |
| 19 | කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 1.81 | 0.02 |
| 20 | කළුතර පො.වි නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 0.18 | 0.18 |
| 21 | කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | 30.00 | 12.71 |
| 22 | කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ස්ථානාධිපති නිළ නිවාස ඉදිකිරීම | 28.19 | - |
| | **එකතුව** | **366.18** | **117.54** |

## 2.1.5 ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

සංඛ්‍යා වගුව - 12

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (TEC) (රු.මි) | 2024-2026 අපේක්ෂිත ප්‍රතිපාදන (රු.මි) |
|---|---|---|---|
| 1 | මුලතිව් පොලිස් ස්ථානය ඉදිකිරීම | 268.72 | 263.72 |
| 2 | වැලිගම පොලිස් ස්ථානය ඉදිකිරීම | 269.23 | 264.23 |
| 3 | නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීම | 478.60 | 235.87 |
| 4 | කොල්ලුපිටිය පොලිස් ස්ථානය අළුත්වැඩියා කිරීම හා හට නිවාසය ඉදිකිරීම | 140.50 | 75.65 |
| 5 | කොළඹ සුභසාධක ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය ඉදිකිරීම | 18.00 | 18.00 |
| 6 | කුරුඳුවත්ත භට නිවාසය ඉදිකිරීම | 175.55 | 155.55 |
| 7 | තිරුක්කෝවිල් පොලිස් ස්ථානය ඉදිකිරීම | 99.80 | 44.01 |
| 8 | කුමාර රත්නම් මාවත විවාහක නිල නිවාසය ඉදිකිරීම | 1,213.77 | 720.55 |
| 9 | මල්ලාවි පොලිස් ස්ථානය ඉදිකිරීම | 63.00 | 23.00 |
| 10 | නාරාහේන්පිට පොලිස් ස්ථානයේ නාන කාමර අලුත්වැඩියා කිරීම හා ජල කාන්දු සකස් කිරීම. | 30.67 | 15.67 |
| 11 | නාරාහේන්පිට පොලිස් ස්ථානයේ පැනල් බෝඩ් සවි කිරීම | 30.00 | 25.00 |
| 12 | නාරාහේන්පිට පොලිසියේ තීන්ත ආලේප කිරීම | 21.87 | 16.87 |
| 13 | නාරාහේන්පිට පොලිස් ස්ථානයේ ගිණි නිවීමේ උපකරණ පද්ධතිය සවි කිරීම | 131.78 | 121.78 |
| 14 | පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම | - | 10.00 |
| 15 | කැකිරාව පොලිස් ස්ථානය ඉදිකිරීම | 63.73 | 63.73 |
| 16 | මීරිගම පොලිස් ස්ථානය ඉදිකිරීම | 85.78 | 85.78 |
| 17 | පිලියන්දල පොලිස් ස්ථානය ඉදිකිරීම | 185.70 | 185.70 |
| 18 | අලව්ව පොලිස් ස්ථානය ඉදිකිරීම | 181.33 | 181.33 |
| 19 | දෙමටගොඩ පොලිස් ස්ථානය ඉදිකිරීම | 335.81 | 335.81 |
| 20 | කොහුවල පොලිස් ස්ථානය ඉදිකිරීම | 331.35 | 331.35 |
| 21 | බොරලැස්ගමුව පොලිස් ස්ථානය ඉදිකිරීම | 394.44 | 394.44 |
| 22 | සියඹලාන්ඩුව පොලිස් ස්ථානය ඉදිකිරීම | 99.27 | 99.27 |
| 23 | දඹගල්ල පොලිස් ස්ථානය ඉදිකිරීම | 93.35 | 93.35 |
| 24 | මැදගම පොලිස් ස්ථානය ඉදිකිරීම | 99.58 | 99.58 |
| 25 | දෙහිවල පොලිස් ස්ථානය ඉදිකිරීම | 288.48 | 288.48 |
| 26 | දියතලාව පොලිස් ස්ථානය ඉදිකිරීම | 186.38 | 186.38 |
| 27 | අලවතුගොඩ පොලිස් ස්ථානය ඉදිකිරීම | 150.00 | 150.00 |
| 28 | වටවල පොලිස් ස්ථානය ඉදිකිරීම | 140.00 | 140.00 |
| 29 | කඩවත පොලිස් ස්ථානය ඉදිකිරීම | 170.00 | 170.00 |
| 30 | එරාවූර් පොලිස් ස්ථානය ඉදිකිරීම | 200.00 | 200.00 |
| 31 | පාදුක්ක පොලිස් ස්ථානය ඉදිකිරීම | 205.14 | 205.14 |
| 32 | කැලණිය පොලිස් ස්ථානය ඉදිකිරීම | 170.00 | 170.00 |
| 33 | සූරියපුර කා.පො.කො භට නිවාසය ඉදිකිරීම | 4.91 | 4.91 |
| 34 | කන්තලේ පරීක්ෂක ශ්‍රේණියේ භට නිවාසය ඉදිකිරීම | 7.19 | 7.19 |

| | | | |
|---|---|---|---|
| 35 | අග්බෝපුර හට නිවාසය ඉදිකිරීම | 2.72 | 2.72 |
| 36 | මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානය ඉදිකිරීම | 216.77 | 216.77 |
| 37 | කොම්පඤ්ඤවීදිය පරීක්ෂක ශ්‍රේණියේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 468.27 | 468.27 |
| 38 | මහනුවර නිල සුනඛ කොට්ඨාසයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 150.88 | 150.88 |
| 39 | විශේෂ ආරක්ෂක දිසාව ගොඩනැගිල්ල ඉදිකිරීම යූනියන් පෙදෙස | 3,650.15 | 2300.00 |
| 40 | මලලසේකර මාවත විශේෂ කාර්යාංශය ඉදිකිරීම | 797.84 | 797.84 |
| 41 | මිරිහාන ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම | 313.51 | 313.51 |
| 42 | උතුරු පළාත ජ්‍යෙ.නි.පො.ප කාර්යාලය ඉදිකිරීම | 87.93 | 87.93 |
| 43 | නැගෙනහිර පළාත ජ්‍යෙ.නි.පො.ප කාර්යාලය ඉදිකිරීම | 55.39 | 55.39 |
| 44 | ඉංගිරිය පොලිස් ගබඩාව ඉදිකිරීම | 50.00 | 50.00 |
| 45 | අංකුඹුර පොලිස් ස්ථානය ඉදිකිරීම | 150.00 | 150.00 |
| 46 | කුඹුක ප්‍රභූ ආරක්ෂක පුහුණු මධ්‍යස්ථානයේ හට නිවාසය ඉදිකිරීම | 47.01 | 47.01 |
| 47 | පුත්තලම පොලිස් ස්ථානයේ පරීක්ෂක ශ්‍රේණියේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 30.00 | 30.00 |
| 48 | කලවංචිකුඩි පොලිස් ස්ථානයේ පරිපාලන ගෙඩනැගිල්ල ඉදි කිරීම | 200.00 | 200.00 |
| **එකතුව** | | **12554.40** | **10252.66** |
| **කටාන පොලිස් අභ්‍යාස ආයතනය** | | | |
| 1 | ස්ථානාධිපති නිල නිවාස ඉදිකිරීම | 34.27 | 9.27 |
| 2 | නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 357.08 | 196.39 |
| 3 | පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | 289.13 | 101.92 |
| 4 | මීටර් 400 ධාවන පථය ඉදිකිරීම | 43.24 | 43.24 |
| 5 | අත්පන්දු හා පැසිපන්දු ක්‍රීඩාංගණය ඉදිකිරීම | 14.00 | 14.00 |
| 6 | කනිෂ්ඨ නිලධාරීන් සඳහා මහල් 03 කින් යුත් නවාතැන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 206.15 | 206.15 |
| | **එකතුව** | **943.87** | **570.97** |
| **කළුතර පොලිස් විද්‍යාලය** | | | |
| 1 | නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම | 484.3 | 469.30 |
| 2 | බොරලන්ද පොලිස් විද්‍යාලයේ අළුවිහාරේ ආදර්ශ පොලිස් ස්ථානය සඳහා වැසිකිළි (Type 4) පද්ධතියක් ඉදිකිරීම | 1.03 | 1.03 |
| 3 | බොරලන්ද පොලිස් විද්‍යාලයේ පෙලපාළි පිටිය අසල (Type 4) වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | 1.03 | 1.03 |
| 4 | බොරලන්ද පොලිස් විද්‍යාලයේ අංක 2 ප්‍රධාන දොරටුව අසල මුර කුටියක් ඉදිකිරීම | 1.15 | 1.15 |
| 5 | බොරලන්ද පොලිස් විද්‍යාලයේ ජෙනරේටර් කාමරයක් ඉදිකරීම | 1.58 | 1.58 |
| 6 | මහියංගනය පොලිස් විද්‍යාලය වටා අලි වැටක් ඉදිකිරීම | 2.15 | 2.15 |
| 7 | ඇල්පිටිය පොලිස් විද්‍යාලයේ පුහුණු ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2.9 | 2.9 |
| **එකතුව** | | **494.14** | **479.14** |

## 2.1.6. මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසිය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ පොලිසියේ කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

**සංඛ්‍යා වගුව - 13**

| වියදම් වර්ගය | 2023 ප්‍රතිපාදන (රු.) | 2023.09.30 දක්වා වියදම (රු) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්ථන | 104,642,380,000.00 | 75,265,569,396.05 | 72% |
| ප්‍රාග්ධන | 13,960,000,000.00 | 11,907,466,959.99 | 85% |

## 2.2. විශේෂ කාර්ය බලකාය

### 2.2.1. හැඳින්වීම

1980 දශකයේ මුල් භාගයේදී උතුරේ ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් එම ප්‍රදේශවල පොලිස් ස්ථානවලට ආරක්ෂාව ලබාදීම හා එම ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම අරමුණු කරගෙන පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ සන්නද්ධ බලකායක් පිහිටුවීම සඳහා පොලිස් නිලධාරීන් 60 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් තෝරාගෙන එම කණ්ඩායමට ශ්‍රී ලංකා යුධ හමුදාව මගින් විශේෂ සන්නද්ධ පුහුණුවක් ලබා දී ප්‍රථමයෙන් උතුරු ප්‍රදේශයේ පොලිස් ස්ථානවල ආරක්ෂාව සඳහා යෙදවූ අතර, මෙම කුඩා ඒකකය සාර්ථක වූ බැවින් ක්‍රමයෙන් එය පුළුල් කරමින් විදේශීය පුහුණු උපදේශකයින් මගින් පුහුණුව ලබා දී "විශේෂ කාර්ය බලකාය" නමින් සෘජුවම උතුරු නැගෙනහිර ත්‍රස්තවාදය මර්ධනය සඳහා යෙදවීම හේතුවෙන් රට තුළ සාමකාමී තත්ත්වයක් උදාකරලීමට අවශ්‍ය දායකත්වය ලැබුණි.

සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි 7,500කට අධික නිලධරීන් සංඛ්‍යාවකින් සමන්විත කඳවුරු 71 ක් සහ අධිවේගී මාර්ගයේ උප මුරපොල 05 ක් ස්ථාපිත කර සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය වෙළඳාම, මහා පරිමාණ වන විනාශ, නීති විරෝධී මැණික් ගැරීම්, පරිසර විනාශයන් වැනි නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් සෘජුවම නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර අනෙකුත් අපරාධ සහ වැරදි සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පොලිසීයට අවශ්‍ය සහය ලබා දෙනු ලබයි.

ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා සහ අනෙකුත් ප්‍රභූවරුන්ද, විදේශ වලින් මෙරටට පැමිණෙන රාජ්‍ය නායකයන් ඇතුළු විශේෂිත ප්‍රභූන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම විශේෂ කාර්‍ය්‍ය බලකායේ ප්‍රමුඛතම කාර්‍ය්‍යයක් වේ.

- **ආයතනයේ අරමුණු සහ කාර්යයන්**

  i. ත්‍රස්ත මර්ධන මෙහෙයුම්.
  ii. සංවිධානාත්මක අපරාධ මර්ධනය හා මත්ද්‍රව්‍ය නිවාරණය.
  iii. ප්‍රභූ ආරක්‍ෂක රාජකාරි.
  iv. පාරිසරික වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම්
  v. විදේශීය සම්භාවනීය අමුත්තන් සඳහා ආරක්ෂාව සැපයීම.
  vi. සෝදිසි හා බෝම්බ නිෂ්ක්‍රීය රාජකාරි.
  vii. නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා පොලිසියට සහය වීම.
  viii. අධිවේගී මාර්ගයේ ගිනි නිවීම හා ජීවිත ගලවා ගැනීමේ රාජකාරි.
  ix. පොලිස් නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා විදේශිය ආයතන සඳහා විශේෂ පුහුණු පාඨමාලා ලබාදීම.

## 2.2.2. විශේෂ කාර්ය බලකාය කාර්තුමය ප්‍රගතිය

- **මානව සම්පත් සංවර්ධනය**

විශේෂ කාර්ය බලකායේ අනුමත සේවක සංඛ්‍යාව 10,743 ක් වන අතර, 2023.09.30 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 7,486 කි. සමාලෝචිත කාලය තුළ දරන්නාට පුද්ගලික උසස්වීම් 1,058 ක් ලබා දී ඇත. පොදු නියෝග 821 ක් ලබා දී ඇත. දැනට සේවයේ නියතු නිලධාරීන් ප්‍රමාණය අනුව ආයතනය තුළ පුරප්පාඩු 3.494 ක් ඇත. සියළු බඳවා ගැනීම් වලට අදාළ කටයුතු වර්ථමානයේ රට තුළ උද්ගතව පවතින ආර්ථික අර්බුදය හමුවේ තාවකාලිකව නතර කර ඇත.

- **පුහුණුව හා සංවර්ධනය**

විශේෂ කාර්ය බලකාය නිලධාරීන්ට පැවරී ඇති කාර්යයන් අනුව අවශ්‍ය දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර විශේෂිත පුහුණු පාඨමාලා 61 ක් මඟින් නිලධරයන් 1,525 දෙනෙකු සඳහා සමාලෝචිත කාලය තුළ පුහුණුව ලබා දෙන ලදි. එසේම බාහිර ආයතන තුළින් ලබා දෙන ලද පුහුණු පාඨමාලා 32 ක් මඟින් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 226 දෙනෙකු ද වශයෙන් සමස්ත නිලධාරීන් 1,751 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇත. එමෙන්ම විශේෂ කාර්ය බලකායේ පුහුණු පාසල මඟින් පවත්වන ලද පාඨමාලා 20කදී වෙනත් ආයතන වල නිලධාරින් හා සිවිල් පුද්ලයින් 245ක් සඳහා පුහුණුව ලබා දී ඇත.

- **සමාලෝචිත කාලය තුළ දී සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය හා අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් ගණන**

සංඛ්‍යා වගුව - 14

| ක්ෂේත්‍රය | | සාර්ථක වූ මෙහෙයුම් ප්‍රමාණය | අත්අඩංගුවට ගත් සැකකරුවන් |
|---|---|---|---|
| **නීති විරෝධී මත්ද්‍රව්‍ය වැටලීම්** | වියළි / කේරළ ගංජා / ගංජා හේන් | 633 | 552 |
| | හෙරොයින් | 765 | 781 |
| | වෙනත් මත්ද්‍රව්‍ය (අයිස් කොකේන්) | 506 | 515 |
| | දුම්වැටි | 33 | 33 |
| | මත්පෙති / මත්කරල් | 77 | 78 |
| **එකතුව** | | **2,014** | **1,959** |
| **සුරාබදු** | **නීති විරෝධී මත්පැන් / රජයේ අරක්කු / විදේශීය මත්පැන්** | **632** | **629** |
| **නීති විරෝධී අවි පුපුරණ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම්** | | **335** | **272** |
| **නීති විරෝධී ඛනිජ සම්බන්ධ වැටලීම්** | වැලි | 554 | 651 |
| | පස් | 96 | 120 |
| | මැණික් ගැරීම | 230 | 567 |
| **එකතුව** | | **880** | **1,338** |
| **වෙනත් නීතිවිරෝධී ක්‍රියා සම්බන්ධ වැටලීම්** | දැව | 280 | 376 |
| | වල්ලපට්ට | 04 | 06 |
| | හිංසාකාරී ලෙස සතුන් ප්‍රවාහනය | 21 | 29 |
| | මාංශ | 34 | 49 |
| | නිදන් හෑරීම | 31 | 111 |
| | කසළ තේ | 11 | 14 |
| | වෙනත් | 316 | 419 |
| **වෙනත් නීති විරෝධී ක්‍රියා සම්බන්ධ වැටලීම් වල එකතුව** | | **697** | **1,004** |
| **මුළු එකතුව** | | **4,558** | **5,202** |

සමාලෝචිත කාලය තුළ සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්, මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන්, විසින් රට තුළ නීති විරෝධී ලෙස භාවිතා කරනු ලැබූ ගිනි අවි 335 ක ප්‍රමාණයක් සැකකරුවන් 272 ක් සමඟ අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත. තවද ගංජා හේන් අක්කර 79 ක ප්‍රමාණයක් ද වියළි ගංජා සහ කේරළ ගංජා කිලෝග්‍රෑම් 1,084.237 ක පමණ ප්‍රමාණයක් ද හෙරොයින් කිලෝග්‍රෑම් 10.642 ක් ද අයිස් කිලෝග්‍රෑම් 14.904 ද වැලි කියුබ් 615 ක් ද දැව ලැලි සහ කඳන් 4,231 ක් ද වශයෙන් අත්අඩංගුවට ගැනීමට ක්‍රියාකර ඇත. මෙම කාලය තුළ අත්අඩංගුවට ගැනීම් මගින් රජයට බැර වූ දඩ මුදල් ප්‍රමාණය රු. 17,720,100.00 ක් පමණ වේ.

- **එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරී**


විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 160 දෙනෙකු සන්නද්ධ පොලිස් කණ්ඩායම් රාජකාරි කටයුතු සඳහා හා තවත් නිලධාරීන් 40 දෙනෙකු ඉහත නිලධාරීන් සඳහා සහය වීමට විශේෂ අවි හා උපක්‍රම කණ්ඩායම් වශයෙන් මුළු නිලධාරීන් 200 දෙනෙකු එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ රාජකාරී සඳහා යෙදවීමට අවශ්‍ය පුහුණුවීම් සිදු කර ඇත. ඒ සඳහා අවශ්‍ය වාහන සහ භාණ්ඩ මිල දී ගැනීමේ කටයුතු 98% ක ප්‍රමාණයක් අවසන්කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිරීක්ෂණ කණ්ඩායමක් පැමිණ විශේෂ කාර්ය බලකායේ සාම සාධක පොලිස් බලමුළුව UN Peacekeeping Capability Readiness System (PCRS) හි මට්ටම 02 දක්වා උසස් කර ඇත. විශේෂ කාර්ය බලකායේ සාම සාධක පොලිස් බලමුළුව මට්ටම 03 දක්වා උසස් කිරීමට නිර්දේශ කර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අදාල අංශයන්හි අනුමැතිය ලබාගැනීමට යොමුකර ඇති බවත් බලමුළු මට්ටම 03 දක්වා උසස්කරන බවත් ලිඛිතව දන්වා ඇත. අවසන් පරීක්ෂණ සිදු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ කණ්ඩායමක් කැඳවීමට අවශ්‍ය ලිපි එක්සත් ජාතින්ගේ මූලස්ථානය වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පරීක්ෂණ අවසන්වූ පසු Rapid Deployment Level - (RDL) මට්ටම දක්වා උසස් කරනු ලබන අතර, එදින සිට දින 60ක් තුල සාම සාධක රාජකාරි සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම Rapid Deployment Level - (RDL) මට්ටම දක්වා උසස් කරනු ලබන දින සිට නඩත්තු පිරිවැයෙන් 25% ක්, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

සාම සාධක රාජකාරි පිටව යාම හා පුහුණු කටයුතු සම්බන්ධව පවතින ගැටලු විසඳා ගැනීමට ත්‍රිවිධ හමුදාව, පොලීසිය, විශේෂ කාර්ය බලකායේ හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින්ගෙන් යුත් කමිටුවක් පත් කිරිමට විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නාම යෝජනා කැඳවීමට අදාලව නිලධාරින් නම්කර ඇත.

මෙම එක්සත් ජාතීන්ගේ සාම සාධක පොලිස් බලමුළු රාජකාරි ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කර මේ වනවිට අවසන් අදියරට පැමිණ ඇත. මෙම වසර අවසානය වන විට සාම සාධක රාජකාරි සඳහා නිලධාරීන් යොමු කිරීමේ හැකියාව පවතින බැවින්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් සම්බන්ධවී ඉදිරි කටයුතු සිදුකිරීම උචිත බව පෙනී යයි.



- **යටිතල පහසුකම් සංවර්ධනය**

    - විශේෂ කාර්ය බලකාය ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මි. 7.18 ක් වියදම්කර 60x20 ගොඩනැගිලි දෙකක් නවීකරණය කරන ලදී.





    - විශේෂ කාර්ය බලකායට අනුයුක්ත පොලිස් කොස්තාපල් තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා (පිරිමි/කාන්තා) විවාහක නිලධාරීන් සඳහා කළුපලුවාව ප්‍රදේශයේ රු.මි 289 ක වටිනාකමින් යුතු අංග සම්පූර්ණ නිල නිවාස 36 ක් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.








    - විශේෂ කාර්ය බලකාය පසු මූලස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා රු.මි. 15ක් වියදම් කර ආපනශාලා ගොඩනැගිල්ල නවීකරණය කිරීමට කටයුතු කරන ලදී.



## 2.2.3. මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා විශේෂ කාර්ය බලකාය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ විශේෂ කාර්ය බලකායට කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව - 15

| 2023 ප්‍රතිපාදන (රු.) | | 2023.09.30 දක්වා වියදම (රු.) | | වියදම් ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 11,565,700,000.00 | 939,000,000.00 | 7,673,902,931.00 | 137,905,284.55 | 66% | 15% |

## 2.2.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

- **ආයතනය විසින් 2024, 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති**

සංඛ්‍යා වගුව - 16

| # | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) | 2024 (රු.මි) | 2025 (රු.මි) | 2026 (රු.මි) |
|---|---|---|---|---|---|
| 1. | රත්මලාන කඳවුරේ ඉදිකිරිමට යෝජිත පස්මහල් ගොඩනැගිල්ල | 1,299 | 100 | 500 | 699 |
| 2. | පාර්ලිමේන්තු භූමියට ආසන්නව දූව ප්‍රදේශයේ යෝජිත කඳවුර ඉදිකිරීමේ පළමු අදියර | 500 | 100 | 200 | 200 |
| 3. | ගෝනහේන බියන්විල විවාහක නිල නිවාස සංකීර්ණය සඳහා ලීටර් 65,000 ජල ටැංකියක් ඉදිකිරිම | 30 | 30 | - | - |
| 4. | අක්කරපත්තුව කඳවුරේ නිලධාරී නිවස්නයක් ඉදිකිරීම | 6.5 | 6.5 | - | - |
| 5. | බුත්තල කඳවුරේ කණිෂ්ඨ භෝජනාගාරය හා මුළුතැන්ගෙය ඉදිකිරීම | 15 | 15 | - | - |
| 6. | කුරුණෑගල කඳවුරේ කණිෂ්ඨ භෝජනාගාරය 60x20 ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | 10 | 10 | - | - |
| 7. | කටුකුරුන්ද කඳවුරේ අංක 03 පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරී නිවස්නය නවීකරණය කිරීම (සේදුම් කාමර ද ඇතුළුව) | 15.5 | 15.5 | - | - |
| 8. | කටුකුරුන්ද කඳවුරේ අංක 39 ගොඩනැගිල්ලට යාබද වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම. | 19.2 | 19.2 | - | - |
| 9. | කටුකුරුන්ද කඳවුරේ කෞතුකාගාරය නවීකරණය කිරීම. | 25 | 25 | - | - |
| 10. | කටුකුරුන්ද කඳවුරේ ප්‍රධාන දේශන ශාලාව නවීකරණය කිරීම. | 36 | 36 | - | - |
| 11. | කටුකුරුන්ද කඳවුරේ භෝජනාගාරය නවීකරණය කිරීම. | 30 | 30 | - | - |
| 12. | මූලස්ථාන කඳවුරේ පස්මහල් ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම. | 20 | 20 | - | - |
| **එකතුව** | | **2,006.2** | **407.2** | **700** | **899** |

## 2.3. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### 2.3.1. හැඳින්වීම

ආගමන විගමන දෙපාර්තමේන්තුව 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේද, 1956 ආගාමික විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේද, පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ පනත් හා එහි සංශෝධනයන්ගේද විධිවිධානයන් යටතේ ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

### 2.3.2. ආගමන විගමන දෙපාර්තමේන්තුවේ කාර්තුමය ප්‍රගතිය

- **ආයතනයේ මෙහෙයුම් කාර්යයන්ගේ ප්‍රගතිය හා නව සම්පත් සංවර්ධනය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකිය නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම, ගමන් බලපත් නිකුත් කිරීම, විදේශිකයන්ට විසා නිකුත් කිරීම, පුරවැසි භාවය ප්‍රධානය කිරීම ආයතනයේ ප්‍රමුඛ කාර්යයන් වේ. එමෙන්ම නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම හා සුහදශීලි සේවයක් සපයා දෙමින් ක්‍රියා කරනු ලබයි.

ආයතනය විසින් දිනකට සේවය සැපයීම සඳහා සැලසුම් කර ඇති ප්‍රමාණයන්ද ඉක්මවා අයදුම්පත් භාර ගැනීමට සිදු වී ඇති අතර මානව හා භෞතික සම්පත යොදවා දිනකට අයදුම්පත් 6000 සීමාව ඉක්මවා ගමන් බලපත්‍ර නිකුත් කිරීම ඇතුළුව දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අනෙකුත් ප්‍රධාන කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.


- **ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය**

සංඛ්‍යා වගුව - 17

| වර්ෂය | සියලු රටවල් | රාජකාරී | රාජ්‍යතාන්ත්‍රික | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2018 | 392,317 | 1,934 | 364 | 21,246 | 2 | 603,732 |
| 2019 | 545,883 | 1,585 | 314 | 19,674 | 1 | 571,373 |
| 2020 | 204,081 | 404 | 175 | 4,738 | 0 | 209,411 |
| 2021 | 381,301 | 860 | 398 | 1 | 0 | 382,560 |
| 2022 | 910,138 | 711 | 249 | 590 | 1 | 911,689 |
| 2023.01.01 සිට 2023.09.30 දක්වා | 735,797 | 867 | 192 | 7,251 | 2 | 744,109 |

මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය

| ගමන් බලපත්‍ර නිකුත් කිරීම් | හදිසි සේවය | සාමාන්‍ය සේවය |
|---|---|---|
| 2023.06.15 සිට 2023.09.30 දක්වා | 10,642 | 18,987 |




- **වීසා නිකුත් කිරීමේ ප්‍රගතිය**


සංඛ්‍යා වගුව - 18

| විස්තරය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023.09.30 දක්වා |
|---|---|---|---|---|---|---|
| ඉ - සංචරණ අනුමැතිය ලබා දීම | 2,307,541 | 1,533,386 | 374,068 | 234,313 | 691,427 | 881,579 |
| වාස වීසා නිකුත් කිරීම | 25,831 | 22,600 | 9,243 | 15,809 | 22,318 | 16,308 |
| වාස වීසා දීර්ඝ කිරීම | 29,948 | 34,596 | 29,691 | 28,595 | 27,392 | 16,641 |
| කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම (සංචාරක, ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් වීසා) | 63,452 | 61,031 | 31,985 | 20,246 | 41,775 | 18,904 |
| ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම (ශ්‍රී ලාංකික) | 1,478 | 1,488 | 339 | 468 | 998 | 3,523 |





මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීම ආරම්භ කල සමාරම්භක අවස්ථාව හෝමාගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය




- **පුරවැසි පනත අනුව නිකුත් කරන ලද සහතික පත් සංඛ්‍යාව**

**සංඛ්‍යා වගුව - 19**

| වගන්තිය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023.01.01 සිට 2023.09.30 දක්වා |
|---|---|---|---|---|---|---|
| 5 (2) වගන්තිය | 10,659 | 11,533 | 13,800 | 16,602 | 9,329 | 7,649 |
| 8 වගන්තිය | 09 | 03 | 02 | 01 | 02 | 08 |
| 11 වගන්තිය | 73 | 22 | 20 | 42 | 58 | 65 |
| 12 වගන්තිය | 24 | 04 | 03 | 06 | 04 | 10 |
| 19 (2) 19 (3) වගන්තිය | 7,888 | 9,147 | 2,267 | 4,654 | 7,166 | 5,461 |
| 20 වගන්තිය | 120 | 58 | 55 | 196 | 92 | 30 |

- **2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන්හි 2023.09.30 ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 20**


| ව්‍යාපෘතිය | 2023 අනුමත ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වව්නියාව විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | 0.50 | 76% | 100% |
| මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම | 2.30 | 78% | 100% |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ ක්‍රමවේදය සඳහා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම | 1.10 | 59% | 80% |
| ප්‍රසම්පාදන අංශය වැඩිදියුණු කිරීම | 1.00 | - | 5% |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ වැඩිදියුණු කිරීම | 1.00 | - | - |

| | | | |
|---|---|---|---|
| වාහන නඩත්තු කිරීම | 12.00 | 11% | 30% |
| කාර්යාල අවශ්‍යතා අනුව කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම | 2.00 | 100% | 100% |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයට අදාළ ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා මේස මිලදී ගැනීම | 2.00 | 100% | 100% |
| යෙදවුම් සර්වරය මිලදී ගැනීම | 249.00 | 88% | 100% |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයට අදාළ Web Camera මිලදී ගැනීම | 3.75 | 83% | 100% |
| LCD screeners & accessories මිලදී ගැනීම | 4.30 | 99% | 100% |
| පරිගණක 100ක් මිලදී ගැනීම | 32.00 | - | 30% |
| Barcode Scanner යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම | 0.80 | 94% | 100% |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයට අදාළ Camera (ICAO) මිලදී ගැනීම | 3.30 | - | 100% |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයට අදාළ Biometric Scanners 5ක් මිලදී ගැනීම | 2.20 | 100% | 100% |
| Laptop 50ක් මිලදී ගැනීම | 20.00 | - | 5% |
| Passport Scanners 10ක් මිලදී ගැනීම | 10.00 | - | 5% |
| Finger Print Scanners 10ක් මිලදී ගැනීම | 5.00 | - | 5% |
| කාර්යාලයේ අවශ්‍යතා අනුව යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 29.65 | 11% | 91% |
| වව්නියාව කාර්යාල ගොඩනැගිල්ලේ ටයිල් ඇතිරීම | 2.00 | - | - |
| ආගමන විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු හුවමාරු කර ගැනීමේ පද්ධතියක් හඳුන්වා දීම | 22.00 | - | 5% |
| ප්‍රතිපත්ති අංශය සඳහා ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් පිහිටුවීම | 27.00 | - | 20% |
| e-embarkation පද්ධතිය හඳුන්වා දීම | 2.00 | - | 80% |
| ICAO Photo Software පද්ධතිය හඳුන්වා දීම | 54.50 | - | - |
| Online TDA ක්‍රමවේදයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා මෘදුකාංග සංවර්ධනය | 2.00 | - | 100% |
| User Management පද්ධතිය හඳුන්වා දීම | 10.00 | - | 5% |
| e-inventory – Finance පද්ධතිය හඳුන්වා දීම | 19.00 | - | 5% |
| Maintenance පද්ධතිය හඳුන්වා දීම | 11.00 | - | 5% |
| සේවක පුහුණුව | 5.00 | 79% | 70% |
| හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීම හා ඉලෙක්ට්‍රොනික් ගමන් බලපත්‍ර ව්‍යාපෘතිය | 1850.00 | 96% | 100% |
| Passport Stamps | 20.00 | - | 20% |
| විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය | 50.00 | 69% | 100% |

- **ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 21**

| විස්තරය | 2022.01.01 සිට 2022.09.30 දක්වා ආදායම (රු.) | 2023.01.01 සිට 2023.09.30 දක්වා ආදායම (රු.) |
|---|---:|---:|
| ගමන් බලපත්‍ර | 6,743,694,761.00 | 9,651,284,342.23 |
| විදේශ දූත මණ්ඩල | 2,421,603,947.31 | 2,599,964,515.57 |
| තොටුපළ | 38,982,650.00 | 159,839,190.34 |
| වීසා | 2,780,479,843.79 | 4,737,240,303.92 |
| විද්‍යුත් සංචරණ | 2,460,147,268.50 | 7,177,658,852.02 |
| පුරවැසි | 545,031,144.96 | 898,514,831.89 |
| **මුළු ආදායම** | **14,989,939,615.56** | **25,224,502,035.97** |




## 2.3.3 මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

**සංඛ්‍යා වගුව - 22**

| විස්තරය | 2023 අනුමත ප්‍රතිපාදන (රු.මි) | 2023.09.30 දක්වා වියදම (රු.මි) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---:|---:|:---:|
| පුනරාවර්තන වියදම් | 2,775 | 1,480 | 53% |
| මූලධන වියදම් | 2,832 | 2,063 | 73% |
| **මුළු එකතුව** | **5,607** | **3,543** | **63.%** |

## 2.3.4 ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

සංඛ්‍යා වගුව - 23

| වැඩසටහන්/ව්‍යාපෘති | 2024 (රු.මි.) | 2025 (රු.මි.) | 2026 (රු.මි.) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 3,080.84 | 3,388.92 | 3,727.82 |
| පුද්ගල පඩිනඩි | 1,010.75 | 1,111.83 | 1,223.01 |
| වැටුප් හා වේතන | 535.92 | 589.51 | 648.46 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 11.30 | 12.43 | 13.67 |
| වෙනත් දීමනා | 463.53 | 509.88 | 560.87 |
| ගමන් වියදම් | 68.73 | 75.60 | 83.16 |
| දේශීය | 60.73 | 66.80 | 73.48 |
| විදේශීය | 8.00 | 8.80 | 9.68 |
| සැපයීම් | 295.66 | 325.23 | 357.75 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 70.85 | 77.94 | 85.73 |
| ඉන්ධන | 139.88 | 153.87 | 169.25 |
| ආහාර පාන හා නිලඇඳුම් | 84.93 | 93.42 | 102.76 |
| නඩත්තු වියදම් | 401.00 | 441.10 | 485.21 |
| වාහන | 35.00 | 38.50 | 42.35 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 15.00 | 16.50 | 18.15 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 1.10 | 1.21 |
| මෘදුකාංග නඩත්තුව | 350.00 | 385.00 | 423.50 |
| සේවා | 1,294.70 | 1,424.17 | 1,566.59 |
| ප්‍රවාහන | 5.80 | 6.38 | 7.02 |
| තැපැල් සහ සන්නිවේදනය | 316.59 | 348.25 | 383.07 |
| විදුලිය සහ ජලය | 228.21 | 251.03 | 276.14 |
| බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 440.00 | 484.00 | 532.40 |
| පිරිසිදු කිරීම් හා සනීපාරක්ෂක සේවා | 41.50 | 45.65 | 50.22 |
| ආරක්ෂක සේවා | 58.80 | 64.68 | 71.15 |
| කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම | 14.00 | 15.40 | 16.94 |
| වෙනත් | 189.80 | 208.78 | 229.66 |
| මාරු කිරීම් | 10.00 | 11.00 | 12.10 |
| රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී | 10.00 | 11.00 | 12.10 |
| මූලධන වියදම් | 5,255.29 | 5,780.82 | 6,358.90 |
| මූලධන වත්කම් පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 75.50 | 83.05 | 91.36 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 62.00 | 68.20 | 75.02 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 8.50 | 9.35 | 10.29 |
| වාහන | 5.00 | 5.50 | 6.05 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 1,470.45 | 1,617.50 | 1,779.24 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10.00 | 11.00 | 12.10 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 719.45 | 791.40 | 870.53 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 1.10 | 1.21 |
| මෘදුකාංග සංවර්ධනය | 740.00 | 814.00 | 895.40 |
| හැකියා වර්ධනය | 15.00 | 16.50 | 18.15 |
| කාර්ය මණ්ඩල පුහුණු | 15.00 | 16.50 | 18.15 |
| වෙනත් මූලධන වියදම් | 3,694.34 | 4,063.77 | 4,470.15 |
| ගමන් ලිපි ලේඛන හා අදාළ උපාංග | 3,594.34 | 3,953.77 | 4,349.15 |
| පැමිණීමේදී නිකුත් කරන වීසා ස්ටිකර් | | | |
| විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය | 100.00 | 110.00 | 121.00 |
| **එකතුව** | **8,336.13** | **9,169.74** | **10,086.72** |

## 2.3.5. අභියෝග හා උපායමාර්ග

සංඛ්‍යා වගුව - 24

| # | අභියෝග | උපායමාර්ග |
|---|---|---|
| 01 | වර්තමානයේ නිකුත් කරනු ලබන ගමන් බලපත්‍රය වෙනුවට නවීන තාක්ෂණයෙන් යුත් ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික චිපයක් සහිත ගමන් බලපත්‍රයක් බවට පරිවර්තනය කිරීම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්ද වැදගත් පියවරකි. | නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මඟින් කඩිනමින් නව ඉ-ගමන් බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම. |
| 02 | වර්තමානයේ මෙන් අධික සේවාලාභීන් පිරිසක් පැමිණෙන අවස්ථාවලදී ඉල්ලුම්කරුවන්ට ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබීම. | පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධිතව අයදුම්පත් භාරගන්නා අවස්ථාවේදීම අදාල ලේඛන වල නිවැරදිභාවය තහවුරු කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. |
| 03 | දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ ආපදා ප්‍රතිසාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම. | ඒ සඳහා නුවරඑළිය ප්‍රදේශයේ හඳුනාගත් ඉඩම අත්පත් කරගෙන අදාළ මධ්‍යස්ථානය ඉදිකිරීම. |
| 04 | ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති තීරණය පරිදි ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරනු ලබන විදේශිකයන් රඳවා තබා ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අපහසු වීම. | වැලිසර ස්ථාපිත කර ඇති රැඳවුම් මධ්‍යස්ථානය හැකිතාක් පහසුකම් සහිතව පවත්වාගෙන යෑමට කටයුතු කිරීම හා අත්පත් කරගත් වැලිසර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපිටිවල ඉඩමේ අංග සම්පූර්ණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම. |
| 05 | ගුවන් තොටුපළ වල දැනට පවතින අවිධිමත් කවුළු විධිමත්ව හා නවීන තාක්ෂණයෙන් සකස් කිරීම. | ගුවන් මඟීන් කවුළු හරහා අවිධිමත් ලෙස රටින් පිටවීම හා ඇතුළුවීම වැළැක්වීම. |

## 2.3.6. 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනාගත සැලසුම්

සංඛ්‍යා වගුව - 25

| # | ව්‍යාපෘතියේ නම |
|---|---|
| 01 | විදේශයන්හිදී විශ්වාසනීයත්වය තහවුරු වන ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යුත් ගමන් බලපත්‍රයක් හඳුන්වා දීම |
| 02 | විදේශගතව සිටින ලාංකිකයන්ට විදේශ ගමන් බලපත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් කිරීමට පහසුකම් සැලසීම |
| 03 | ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම්කරන අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම |
| 04 | ගුවන්තොටුපල හා වරායන් සඳහා වඩා ආරක්ෂිත උපක්‍රම සහිතව මගී නිෂ්කාශනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම |
| 05 | ඇඟිලි සලකුණු ලබා ගැනීමට අදාල ජෛවමිතික පද්ධතිය වැඩි දියුණු කිරීම හා මුහුණේ ජෛවමිතික සලකුණු ලබා ගැනීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම |
| 06 | සංචාරකයින්ට වඩා මිත්‍රශීලී ලෙස හා වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගත හැකි ආකාරයට විද්‍යුත් සංචරන අනුමැතියට අනුව පද්ධතිය වැඩි දියුණු කිරීම |

## 2.4. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### 2.4.1. හැඳින්වීම

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1972 වර්ෂයේ සිට වයස අවුරුදු 18 ඉක්ම වූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. අනතුරුව, 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2016 ජූලි 07 වන දින සිට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ වයස් සීමාව අවුරුදු 15 ලෙස සංශෝධනය කරන ලදී.

ආරම්භයේ පටන් කොළඹ 05, කැප්පෙටිපොළ පාර, අංක 38 ලිපිනයෙහි පිහිටුවා තිබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය 2016 සැප්තැම්බර් 26 දින සිට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය" ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කරන ලදී.

දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට සිංහල භාෂාවෙන් පමණක් ජාතික හැඳුනුම්පත සකස් කරන ලද නමුත් සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් හැඳුනුම්පත් ලියා නිකුත් කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC Application No.93/2013(F/R) දරණ මානව හිමිකම් පෙත්සම් විභාගය සම්බන්ධයෙන් එම අධිකරණය විසින් ලබා දී ඇති නියෝගය අනුව 2014.02.28 දින සිට මෙම දෙපාර්තමේන්තුව මඟින් සිංහල හා දෙමළ ද්වී භාෂාවෙන් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරන ලදී.

වර්තමානයේදී, ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා දියත් කරනු ලැබූ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ගනු ලැබූ පළමු පියවර වශයෙන් 2017.10.27 දින සිට සිංහල, දෙමළ හා ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ජාතික හැඳුනුම්පත් (සුහුරු කාඩ්පත්) නිකුත් කරනු ලබයි.

- **ආයතනයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්**
  - සාමාන්‍ය සේවය යටතේ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම
  - එක්දින සේවය යටතේ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම
  - ජාතික හැඳුනුම්පත් සම්බන්ධ සේවා සැපයීම මඟින් ආදායම් ඉපයීම

- **ආයතනයේ නෛතික පදනම**
  - 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත
  - 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

## 2.4.2. ආයතනයේ ක්‍රියාකාරකම් වල කාර්තුමය ප්‍රගතිය

- **ආයතනයේ කාර්ය සාධක දර්ශක**

මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් අනුව, නිමැවුම පැහැදිලිව මැනිය හැකි ප්‍රධාන කාර්යසාධක දර්ශක 03ක් හඳුනා ගෙන ඇත. ඒ නම්,

01. වාර්ෂිකව සාමාන්‍ය සේවය යටතේ ලද ඉල්ලුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව
02. වාර්ෂිකව එක්දින සේවය යටතේ ලද ඉල්ලුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව
03. දෙපාර්තමේන්තුවේ වාර්ෂික අපේක්ෂිත ආදායම හා උපයාගත් සත්‍ය ආදායම

- **නව, සංශෝධන හා අනුපිටපත් ඉල්ලුම්පත්‍ර - සාමාන්‍ය සේවය මගින් නිකුත් කළ ප්‍රමාණය**

සංඛ්‍යා වගුව - 26

| අනු අංකය | ක්‍රියාකාරකම | ගණන |
|---|---|---|
| 1 | 2022.12.31 දිනට නිකුත් කිරිමට ඉතිරි වූ ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය **** | 184,430 |
| 2 | 2023.01.01-2023.09.30 දක්වා ලද ඉල්ලුම්පත් ප්‍රමාණය | 591,638 |
| 3 | 2023.01.01-2023.09.30 දක්වා නිකුත් කළ හැඳුනුම්පත් තොරතුරු තහවුරු ලිපි ප්‍රමාණය ** | 349,267 |
| 4 | අඩුපාඩු ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය *** | 30,152 |
| 5 | වයස අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය | 24,244 |

- **නව, සංශෝධන හා අනුපිටපත් ඉල්ලුම්පත්‍ර - එක්දින සේවාව මගින් නිකුත් කළ ප්‍රමාණය**

සංඛ්‍යා වගුව - 27

| අනු අංකය | ක්‍රියාකාරකම | ගණන |
|---|---|---|
| 1 | 2023.01.01 - 2023.09.30 දක්වා ලැබුණු ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය | 185,857 |
| 2 | 2023.01.01 - 2023.09.30 දක්වා නිකුත් කළ හැඳුනුම්පත් ප්‍රමාණය | 191,255 |
| 3 | අඩුපාඩු ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය **** | 1,929 |

- **2023.09.30 දිනට සමස්ථ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ප්‍රගතිය**

සංඛ්‍යා වගුව - 28

| අනු අංකය | ක්‍රියාකාරකම | ගණන |
|---|---|---|
| 1 | 2022.12.31වන දිනට නිකුත් කිරීමට ඉතිරි වූ හැඳුනුම්පත් ප්‍රමාණය | 184,430 |
| 2 | 2023.09.30 වන දිනට දෙපාර්තමේන්තුවට ලැබුණු ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය | 777,495 |
| 3 | 2023.09.30 වන දිනට නිකුත් කර ඇති හැඳුනුම්පත් ප්‍රමාණය | 540,522 |
| 4 | 2023.09.30 වන දිනට අඩුපාඩු හා වයස අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය | 56,325 |
| 5 | 2023.09.30 වන දිනට නිකුත් කිරීමට ඉතිරිව ඇති සමස්ත ජාතික හැඳුනුම්පත් ප්‍රමාණය | 421,403 |

සටහන :-

I. දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය මගින් ලබා ගත් දත්ත පදනම් කරගෙන සකස් කර ඇත.
II. ** නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව සහ තොරතුරු තහවුරු කිරීමේ ලිපි සංඛ්‍යාවේ එකතුව සලකන ලදී.
III. *** අඩුපාඩු හේතුවෙන් පද්ධතියේ රඳවාගෙන ඇති සියලුම ඉල්ලුම්පත්‍ර සාමාන්‍ය හා එක්දින සේවයට අදාළව වෙන වෙනම ඇතුළත් කර ඇත.
IV. **** පාසල් ඉල්ලුම්කරුවන් වෙත නිකුත් කරන ලද තොරතුරු තහවුරු කිරීමේ ලිපි ප්‍රමාණයද අඩු කර ශේෂය ඉදිරියට ගෙන එන ලදී.

- **2023.01.01 - 2023.09.30 දක්වා හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 29**

| මාසය | ලැබුණු මුළු ඉල්ලුම්පත්‍ර ප්‍රමාණය | | | | | | | | | නිකුත් කළ මුළු ජා.හැඳුනුම්පත් සහ තොරතුරු තහවුරුකිරීමේ ලිපි ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය සේවය | | | | එක්දින සේවය | | | | | සාමාන්‍ය සේවය | | | එක්දින සේවය | මුළු එකතුව |
| | නව | අනු පිටපත් | සංශෝධන | එකතුව | නව | අනු පිටපත් | සංශෝධන | එකතුව | මුළු එකතුව | ජා.හැ. පත් | තොරතුරු තහවුරු ලිපි | එකතුව | | |
| ජනවාරි | 43,520 | 8,156 | 15,120 | 66,796 | 818 | 8,125 | 10,624 | 19,567 | 86,363 | 9,712 | 73,950 | 83,662 | 20,757 | 104,419 |
| පෙබරවාරි | 31,656 | 6,921 | 13,197 | 51,774 | 758 | 8,278 | 10,858 | 19,894 | 71,668 | 5,009 | 16,045 | 21,054 | 21,081 | 42,135 |
| මාර්තු | 49,287 | 7,306 | 12,823 | 69,416 | 805 | 8,183 | 11,135 | 20,123 | 89,539 | 6,795 | 8,241 | 15,036 | 20,060 | 35,096 |
| අප්‍රේල් | 40,463 | 5,014 | 8,074 | 53,551 | 462 | 5,278 | 6,511 | 12,251 | 65,802 | 4,736 | 11,984 | 16,720 | 12,357 | 29,077 |
| මැයි | 56,341 | 6,728 | 11,205 | 74,274 | 717 | 8,163 | 10,431 | 19,311 | 93,585 | 9,110 | 23,429 | 32,539 | 20,086 | 52,625 |
| ජූනි | 60,163 | 6,737 | 12,259 | 79,159 | 854 | 8,229 | 11,483 | 20,566 | 99,725 | 11,092 | 4,127 | 15,219 | 20,839 | 36,058 |
| ජූලි | 43,585 | 7,604 | 14,394 | 65,583 | 1369 | 8,986 | 13,410 | 23,765 | 89,348 | 16,881 | 5,918 | 22,799 | 23,947 | 46,746 |
| අගෝස්තු | 39,537 | 10,217 | 20,442 | 70,196 | 1,486 | 10,435 | 15,969 | 27,890 | 98,086 | 74,196 | 6,200 | 80,396 | 29,246 | 109,642 |
| සැප්තැම්බර් | 36,082 | 8,244 | 16,563 | 60,889 | 890 | 8,806 | 12,794 | 22,490 | 83,379 | 59,392 | 2,450 | 61,842 | 22,882 | 84,724 |
| එකතුව | 400,634 | 66,927 | 124,077 | 591,638 | 8,159 | 74,483 | 103,215 | 185,857 | 777,495 | 196,923 | 152,344 | 349,267 | 191,255 | 540,522 |

❖ දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය මඟින් ලබාගත් දත්ත පදනම් කරගනිමින් සකස් කරන ලද්දකි.

- **ආයතනයේ අපේක්ෂිත ආදායම හා උපයාගත් සත්‍ය ආදායම 2023.09.30 දින දක්වා**

**සංඛ්‍යා වගුව -30**

| 2023 ආදායම් ඇස්තමේන්තු රු. | ආදායම් ලැබීම් රු. 2023.09.30 දක්වා | ප්‍රගතිය % |
|---|---|---|
| 645,000,000.00 | 842,500,080.00 | 131% |

| මාසය | එක්දින සේවා ආදායම් (රු.) | අයදුම්පත් ගාස්තු (රු.) | දඩ මුදල් (රු.) | සේවා ගාස්තු (රු.) | මාර්ගගත දත්ත හුවමාරු ආදායම් (රු.) | ප්‍රධාන කාර්යාලය සහ දකුණු පළාත්කාර්යාල යේ මුළු ආදායම (රු.) | ප්‍රා.ලේ. කාර්යාල මඟින් එකතු කරන ලද අයදුම්පත් ගාස්තු සහ දඩමුදල් (රු.) | මුළු ආදායම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 39,406,000.00 | 113,750.00 | 646,900.00 | 1,026,400.00 | - | 41,193,050.00 | 49,395,155.00 | 90,588,205.00 |
| පෙබරවාරි | 40,277,000.00 | 92,150.00 | 562,200.00 | 927,500.00 | 529,800.00 | 42,388,650.00 | 47,765,485.04 | 90,154,135.04 |
| මාර්තු | 40,154,000.00 | 229,400.00 | 588,200.00 | 992,500.00 | 770,875.00 | 42,734,975.00 | 65,934,039.96 | 108,669,014.96 |
| අප්‍රේල් | 24,172,000.00 | 58,200.00 | 318,500.00 | 824,700.00 | 359,200.00 | 25,732,600.00 | 32,744,366.00 | 58,476,966.00 |
| මැයි | 39,394,500.00 | 105,600.00 | 485,950.00 | 1,078,569.74 | 518,825.00 | 41,583,444.74 | 45,252,012.00 | 86,835,456.74 |
| ජූනි | 40,252,000.00 | 91,400.00 | 531,100.00 | 1,120,580.26 | 482,525.00 | 42,477,605.26 | 42,674,152.00 | 85,151,757.26 |
| ජූලි | 49,566,000.00 | 138,450.00 | 790,250.00 | 1,149,100.00 | 1,196,250.00 | 52,840,050.00 | 56,399,050.00 | 109,239,100.00 |
| අගෝස්තු | 56,074,000.00 | 87,200.00 | 846,200.00 | 1,082,850.00 | 625,350.00 | 58,715,600.00 | 58,605,633.00 | 117,321,233.00 |
| සැප්තැම්බර් | 45,802,000.00 | 84,150.00 | 616,000.00 | 946,500.00 | 495,925.00 | 47,944,575.00 | 48,119,637.00 | 96,064,212.00 |
| ඔක්තෝම්බර් | - | - | - | - | - | - | - | - |
| නොවැම්බර් | - | - | - | - | - | - | - | - |
| දෙසැම්බර් | - | - | - | - | - | - | - | - |
| | 375,097,500.00 | 1,000,300.00 | 5,385,300.00 | 9,148,700.00 | 4,978,750.00 | 395,610.550.00 | 446,889,530.00 | 842,500,080.00 |

- **පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව -31**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | 2023.01.01 / 2023.09.30 දක්වා ප්‍රගතිය | සහභාගී වූ සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | එක්දින සේවාව සහ පෙරටු කාර්යාලයේ රාජකාරිවල කාර්යක්ෂමතාවය හා සඵලදායිතාවය ඉහල නැංවීම පිළිබඳ පුහුණු වැඩසටහන | 6,480.00 | 30 |
| 2 | 2023 ස්ථාන මාරු වීම් ලද නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන | 15,400.00 | 40 |
| 3 | අංශ මට්ටමින් පැවැත්වෙන දැනුම කළමනාකරණ පුහුණු වැඩසටහන - (සියලු අංශ ආවරණය වන පරිදි පවත්වා ඇත) | 25,820.00 | 213 |
| 4 | විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩසටහන | 28,500.00 | 03 |
| 5 | දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන | 102,000.00 | 261 |
| 6 | කාර්යාල කලමනාකරණය හා මුදල් රෙගුලාසි | 30,000.00 | 04 |
| 7 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (Zoom) පවත්වනු ලබන පැය 150 ද්විතියික දෙමළ පාඨමාලාවේ සම්පත්දායකගේ දේශක ගාස්තු | 112,500.00 | 109 |
| 8 | ලිපිගොනුකරණය පුහුණු වැඩසටහන | 30,000.00 | 06 |
| 9 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන | 20,000.00 | 02 |
| 10 | කාර්යාල උපකරණ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන | 15,000.00 | 02 |
| 11 | පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු වැඩසටහන | 19,000.00 | 02 |
| 12 | ග්‍රැපික් නිර්මාණය හා බහුමාධ්‍ය සන්නිවේදන කුසලතාව පිළිබඳ පුහුණු පාඨමාලාව | 30,750.00 | 01 |
| 13 | රාජ්‍ය ප්‍රසම්පාදන හා ගිවිසුම් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 138,000.00 | 01 |
| 14 | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන | 30,000.00 | 06 |
| 15 | පුරවැසි පනත හා ඒ ආශ්‍රිත කාර්යයන් පිළිබඳ පුහුණු වැඩසටහන | 32,510.00 | 220 |
| | | **635,960.00** | **900** |




- **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හැඳුනුම්පත්වල තොරතුරු තහවුරු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය**



2019 වර්ෂයේ සිට 2023.09.30 දක්වා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හැඳුනුම්පත්වල තොරතුරු තහවුරු කිරීමේ සේවාව සඳහා ආයතන 132කින් ඉල්ලීම් ලැබී ඇත. ආයතන 88ක් සඳහා උක්ත ක්‍රමවේදය සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන කර ඇත. එමෙන්ම 2023.01.01 දින සිට 2023.09.30 දක්වා ආයතන 07 කින් ඉල්ලීම් කර ඇති අතර ඉල්ලීම් කර තිබූ ආයතන 12 ක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.

- **ලේඛනාගාරයේ ප්‍රගතිය**

  - ලේඛනාගාරයේ කටයුතු වල ප්‍රගතිය මැනීම සම්බන්ධයෙන් නව ආකෘති හඳුන්වාදීම සහ සති/මාසික වාර්තා ලබා ගැනීම මගින් ලේඛනාගාරයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට කටයුතු යොදා ඇත.
  - දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ලේඛනාගාරයෙන් සිදු කරනු ලබන ඉල්ලුම්පත් සම්බන්ධ විමසීම්වලදී වඩාත් කාර්යක්ෂමව තොරතුරු ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව එක්දින සේවය සඳහා ඉහල ප්‍රමුඛතාවයක් ලබා දී අයදුම්පත් සෙවීමේ කටයුතු උපරිම දින 2ක් තුළ සිදු කිරීමටත්, ප්‍රමුඛතාවය සඳහන් නොවන අනිකුත් අයදුම්පත් සෙවීමේ කටයුතු දින 5ක් තුල සිදුකර අවසන් කිරීමටත් කටයුතු යොදා ඇත.
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩ අවසන් ඉල්ලුම්පත් හා මුද්දර කවර ලේඛනාගාරය වෙත යොමු කිරීමේදී පවතින අඩුපාඩු නිරන්තරයෙන් වාර්තා කිරීම හා අධීක්ෂණය කිරීම මගින් 2022 වර්ෂයට සාපේක්ෂව 70% කින් පමණ අඩුපාඩු අඩුවී ඇති බව නිරීක්ෂණය වී ඇත.

- **පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට අදාල කටයුතුවල ප්‍රගතිය**

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම්පත නිකුත් කිරීමට අදාළව කරන ලද සංශෝධනයන් හි අවසන් සංශෝධන කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ කාර්යයන් සඳහා ගාස්තු අය කර ගැනීමට අදාලව 2017 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග අංක 01 නියෝග සඳහා කරන ලද සංශෝධන නියෝග කෙටුම්පත මේ වනවිට පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති බැවින් එම නියෝග කෙටුම්පත මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- **වෙනත් ආයතන සමග ගිවිසුම්ගත වීම**

මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විදේශ ගමන් බලපත්‍ර සැකසීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන් හි සේවය ලබා දීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

- **අභ්‍යන්තර විගණන කටයුතු වල ප්‍රගතිය**

  අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව 72% කි.

## 2.4.3. මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව - 32

| විස්තරය | 2023 අනුමත ප්‍රතිපාදන (රු.) | 2023.09.30 දක්වා වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 1,750,000,000.00 | 969,274,146.36 | 57.22% |
| මූලධන වියදම් | 1,270,000,000.00 | 276,397,981.23 | 21.76% |
| **මුළු එකතුව** | **3,020,000,000.00** | **1,245,672,127.59** | **41.24%** |

## 2.4.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

සංඛ්‍යා වගුව - 33

| උප ව්‍යාපෘතිය | වැය විෂයය | අයිතමය | මූලාශ්‍රය | කාණ්ඩය/වැය විෂයය/අයිතම විස්තරය | අයවැය 2024 (රු.මි) | පුරෝකථනය 2025 (රු.මි) | 2026 (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| | | | | පුනරාවර්ථන වියදම | 1,754.60 | 1,842.33 | 1,934.45 |
| | | | | පුද්ගල පඩිනඩි | 922.50 | 968.63 | 1,017.06 |
| | 1001 | | | වැටුප් හා වේතන | 581.00 | 610.05 | 640.55 |
| | 1002 | | | අතිකාල හා නිවාඩු දින වැටුප් | 37.50 | 39.38 | 41.34 |
| | 1003 | | | වෙනත් දීමනා | 304.00 | 319.20 | 335.16 |
| | | | | ගමන් වියදම් | 3.00 | 3.15 | 3.31 |
| | 1101 | | | දේශීය | 2.00 | 2.10 | 2.21 |
| | 1102 | | | විදේශීය | 1.00 | 1.05 | 1.11 |
| | | | | සැපයීම් | 125.82 | 132.11 | 138.72 |
| | 1201 | | | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 99.00 | 103.95 | 109.15 |
| | 1202 | | | ඉන්ධන | 26.00 | 27.30 | 28.67 |
| | | 2 | | මාණ්ඩලික නිළධාරීන් සඳහා ඉන්ධන | 4.50 | 4.73 | 4.96 |
| | | 9 | | සංචිත වාහන සඳහා ඉන්ධන | 20.70 | 21.74 | 22.82 |
| | | 10 | | වෙනත් අවශ්‍යතා සඳහා ඉන්ධන | 0.80 | 0.84 | 0.88 |
| | 1203 | 2 | | ආහාර පාන හා නිල ඇඳුම් | 0.22 | 0.23 | 0.24 |
| | 1205 | | | වෙනත් | 0.60 | 0.63 | 0.66 |
| | | | | නඩත්තු වියදම් | 33.60 | 35.28 | 37.04 |
| | 1301 | | | වාහන | 7.50 | 7.88 | 8.28 |
| | 1302 | | | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2.60 | 2.73 | 2.87 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 1303 | | | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.50 | 2.63 | 2.76 |
| | 1304 | | | මෘදුකාංග නඩත්තු | 21.00 | 22.05 | 23.15 |
| | | | | සේවා | 662.68 | 695.81 | 730.61 |
| | 1401 | | | ප්‍රවාහන | 3.10 | 3.26 | 3.42 |
| | 1402 | | | තැපැල් හා සන්නිවේදන | 84.00 | 88.20 | 92.61 |
| | 1403 | | | විදුලිය හා ජලය | 100.00 | 105.00 | 110.25 |
| | 1404 | | | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 240.50 | 252.53 | 265.15 |
| | 1405 | | | සනීපාරක්ෂක | 19.00 | 19.95 | 20.95 |
| | 1407 | | | ආරක්ෂක සේවා | 14.00 | 14.70 | 15.44 |
| | 1408 | | | මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම | 2.58 | 2.71 | 2.84 |
| | 1409 | | | වෙනත් | 199.50 | 209.48 | 219.95 |
| | | 138 | | යන්ත්‍රෝපකරණ හා කාර්යාලයීය උපකරණ සේවා කිරීම | 187.00 | 196.35 | 206.17 |
| | | 139 | | වාහන රක්ෂණය | 1.00 | 1.05 | 1.10 |
| | | 140 | | වෙනත් සේවා වියදම් | 11.50 | 12.08 | 12.68 |
| | | | | මාරු කිරීම් | 7.00 | 7.35 | 7.72 |
| | 1506 | | | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී | 7.00 | 7.35 | 7.72 |
| | | | | වෙනත් පුනරාවර්ථන වියදම් | | | |
| | 1701 | | | පාඩු සහ කපාහැරීම් | | | |
| | | | | මුලධන වියදම් | 1,366.48 | 1,434.80 | 1,506.54 |
| | | | | මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10.75 | 11.29 | 11.86 |
| | 2001 | | | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4.50 | 4.73 | 4.96 |
| | 2002 | | | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3.80 | 3.99 | 4.19 |
| | 2003 | | | වාහන | 2.45 | 2.57 | 2.70 |
| | | | | මුලධන වත්කම් අත්පත් කර ගැනීම | 83.00 | 87.15 | 91.51 |
| | 2102 | | | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 4.00 | 4.20 | 4.41 |
| | 2103 | | | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 79.00 | 82.95 | 87.10 |
| | | | | හැකියා වර්ධනය | 1.53 | 1.60 | 1.68 |
| | 2401 | | | කාර්යය මණ්ඩල පුහුණු | 1.53 | 1.60 | 1.68 |
| | | | | වෙනත් මුලධන වියදම් | 1.20 | 1.26 | 1.32 |
| | 2505 | | | ප්‍රසම්පාදන පෙර සූදානම් වීම | 1.20 | 1.26 | 1.32 |
| | | | | පෙර මුද්‍රිත කාඩ්පත් සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 1,270.00 | 1,333.50 | 1,400.18 |
| | 2509 | | | වෙනත් | 1,270.00 | 1,333.50 | 1,400.18 |
| | | | | **මුළු වියදම්** | **3,121.08** | **3,277.13** | **3,440.99** |

# 2.5 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

## 2.5.1 හැඳින්වීම

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ පනත යටතේ පිහිටුවා ඇති ආයතනයකි. රාජ්‍ය නොවන සංවිධාන වලට දේශීය හා විදේශීය මූලාශ්‍ර මගින් ලැබෙන මූල්‍යමය හා අනෙකුත් සම්පත් රටෙහි නෛතික හා ප්‍රතිපත්ති රාමුවතුල රටේ සංවර්ධනය පිනිස පමනක් යොදා ගන්නා බව තහවුරු කිරීම සිදු කරනු ලබයි. රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල අගයන් ප්‍රතිලාභීන්ගේ සුභසිද්ධිය සඳහා පමනක් බව අධීක්ෂණය කිරීම, එම සංවිධාන වලට රටේ සංවර්ධන කොටස් කරුවන් වීමට අවශ්‍ය නිදහස හා හිතකර පරිසරය නිර්මාණය කිරීමද සිදු කරනු ලබයි. එමෙන්ම දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජාමූල සංවිධාන නියාමනය, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම මගින් යහපත් සංවර්ධිත රටක් නිරමාණය කිරීම සඳහා ක්‍රියාකාරීව දායකවීම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

## 2.5.2. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්තුමය ප්‍රගතිය

- **මානව සම්පත් සංවර්ධනය**

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 77 ක් වන අතර, 2023.09.30 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 58 කි. ඒ අනුව සමස්ත කාර්යය මණ්ඩල අවශ්‍යතාවයෙන් 75% ක් 2023 වර්ෂයේ තුන්වන කාර්තුව අවසාන වන විට සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ කාර්යභාරය හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් පවත්වා ගෙන යනු ලබයි.

- **ක්‍රියාකාරකම් වල ප්‍රගතිය**

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ පහක් යටතේ සිය කාර්යයන් ඉටු කරනු ලබයි. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අංශය, වීසා සහ වැඩ බලපත් සඳහා නිර්දේශ නිකුත් කිරීමේ අංශය, අධීක්ෂණ අංශය, විමර්ශන අංශය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය වශයෙනි. ඒ යටතේ සිදු කරනු ලැබූ විශේෂ කාර්යයන් වල තොරතුරු

I. දැනට ක්‍රියාත්මක1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත වෙනුවට නව පනතක් ඉදිරිපත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත කෙටුම්පත් කිරීම අවසන් කර ඇත.

II. කාර්යාලීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා රේඛිය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලීය ආරම්භ කර ඇත.

III. රාජ්‍ය නොවන සංවිධාන මගින් රටට ගලා එන අරමුදල් ත්‍රස්ත ක්‍රියාවන්ට හෝ නීති විරෝධී ක්‍රියාවන්ට යොදවා ගැනීම වැලැක්වීම සඳහා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමග කටයුතු කරමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.

IV. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක වන සියළුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය සහ නියාමනය කිරීම.

V. දිස්ත්‍රික් අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවීම.

VI. දිස්ත්‍රික් සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමේ කටයුතු ආරම්භ කරමින් කොළඹ දිස්ත්‍රික් සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

VII. රාජ්‍ය නොවන සංවිධාන වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් සංවිධාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය සහ නියාමනය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල රාජකාරී සඳහා මෙරටට පැමිණෙන විදේශිකයින් වෙනුවෙන් වීසා බලපත් නිකුත් කිරීම යන කාර්යයන් සරල කිරීම සඳහා කටයුතු කිරීම.

- **රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අංශයේ ප්‍රගතිය**

සංඛ්‍යා වගුව - 34

| අංශය | කරන ලද කාර්යය | සංවිධාන ගණන |
|---|---|---|
| රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අංශය | 01. රාජ්‍ය නොවන සංවිධාන නව ලියාපදිංචි කිරීම් | 48 |
| | 02. ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලැබූ බවට සනාථ කරමින් ලියාපදිංචි නිකුත් කිරීම. | 54 |
| | 03. අක්‍රිය සංවිධාන නැවත ක්‍රියාකාරී සංවිධාන බවට පත්කිරීම. | 11 |
| | 04. ජාත්‍යන්තර මූල්‍ය ආයතන සඳහා වීසා නිර්දේශ නිකුත් කිරීම | 34 |
| | 05 රාජ්‍ය බුද්ධි අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුව විසින් විමර්ෂණ කටයුතු සඳහා තොරතුරු ඉල්ලා ඇති සංවිධාන වෙනුවෙන් වාර්තා ලබා දීම. | 22 |
| | 06. දිස්ත්‍රික් හා ප්‍රදේශිය ලේකම් කාර්යාල වෙත රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ සහතිකපත් නිකුත් කිරීම | 915 |
| | 07. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සඳහා අයදුම්පත් නිකුත් කිරීම | 218 |
| | 09. මුළු ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන ගණන (ජාතික මට්ටමේ සංවිධාන)<br>දේශීය - 1,358<br>විදේශීය - 404 | 1,762 |
| | 09. දිස්ත්‍රික්ක මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම | 1,370 |
| | 10. ප්‍රාදේශිය මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම (ප්‍රාදේශිය ලේකම් කාර්යාල 241 දත්ත යාවත්කාලීන කරමින් පවති. ) | 25,611 |
| වීසා අංශය | වීසා නිර්දේශ නිකුත් කිරීම | |
| | i. කෙටිකාලීන | 53 |
| | ii. ප්‍රවේශ වීසා | 71 |
| | iii. වාස වීසා | 53 |

| | | |
|---|---|---|
| | iv. වාසස වීසා දීර්ඝ කිරීම | 93 |
| | v. වැඩ බලපත්‍ර | 114 |
| අධීක්ෂණ අංශය | අදාළ වාර්තා ගෙන්වා ගැනීම සහ අධීක්ෂණය කිරීම | |
| | i.ක්‍රියාකාරී සැලැස්ම 2023 - | 823 |
| | ii. ප්‍රගති වාර්තා2023 - | 471 |
| | iii. විගණන වාර්තා 2022 - | 56 |
| | iv. ලියාපදිංචිය ඉවත්කිරීම් | 02 |
| | v. වාර්තා අධීක්ෂණය කිරීමෙන් පසු හඳුනාගත් අඩුපාඩු පිළිබඳව දැනුවත් කළ ආයතන සංඛ්‍යාව | 143 |
| ක්ෂුද්‍ර මූල්‍ය අංශය | 01. ලියාපදිංචි ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන යටතේ යාවත්කාලීන කිරීම | 16 |
| විමර්ශන අංශය | 01. ප්‍රජා භාරකාර අරමුදල අන්තර් කළමනාකරණ මණ්ඩල<br>• මේ සම්බන්ධයෙන් අන්තර් කළමනාකරණ මන්ඩලය 2022/12/06 වන දින පත් කරන ලද අතර සංවිධානයේ මූල්‍ය තත්වය හා කළමණාකරණය යථා තත්වයට පත්කර 2023.09.18 වන දින නිලධාරි මණ්ඩලය වෙත ප්‍රජා භාරකාර අරමුදල නමැති සංවිධානය භාරදී ඇත.<br>02. සංහිඳ ළමා නිකේතන පාලක සභාවේ අන්තර් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු අක්‍රියව පැවති අතර, ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු වී ඇත. | |
| | 03. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීමේ හා අධික්ෂණය කිරීමේ පනත වෙනුවට නව පනතක් සකස් කිරීම.<br>2023/09/26 දිනැතිව නිතී කෙටුම්පත් සම්පාදක විසින් සකස් කල අවසන් කෙටුම්පත සඳහා අමාත්‍යාංශයේ එකගතාවය ලබා ගෙන ඇත. | |

- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත කාලය තුළ මෙරටට ආධාර වශයෙන් රු. 31,070,952,724.14 ක මුදලක් ලබා ගැනීමට කටයුතු කර තිබේ.





### 2.5.3. මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

**සංඛ්‍යා වගුව - 35**

| 2023 ප්‍රතිපාදන (රු.) | | 2023.09.30 දක්වා වියදම (රු.) | | වියදම් ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 63,500,000.00 | 3,000,000.00 | 41,454,357.77 | 357,390.00 | 65.2% | 11.9% |

### 2.5.4. ආයතනයේ මධ්‍යකාලීන ඉලක්ක 2024 - 2026

**සංඛ්‍යා වගුව - 36**

| # | වැඩසටහන / ව්‍යාපෘතිය | 2024 (රු.මි.) | 2025 (රු.මි.) | 2026 (රු.මි.) |
|---|---|---|---|---|
| 01. | ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉල්ලීම් | 11.30 | 12.50 | 15.00 |

## 2.6 අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

### 2.6.1 හැඳින්වීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම හා පාලනය කිරීමට විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවල සහාය ලබා ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාමාර්ග වල නිරත වීම සිදු කරයි. එමෙන්ම ප්‍රතිකාර ක්‍රම හා පුනරුත්ථාපන කටයුතු ප්‍රවර්ධනය කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ සහ රසායනාගාර විශ්ලේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා දත්ත සංචිතයන් පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සහ අන්තර්ජාතික මාදක පාලක ජාතික මණ්ඩලය වැනි ආයතන සමඟ සම්බන්ධීබරණය පවත්වාගෙන යාම සහ ජාත්‍යන්තර සම්මුතීන් වලට අදාළ වගකීම ඉටු කිරීම, අදාළ ආයතන අධීක්ෂණය හා ඒවාට සහාය දැක්වීම සිදු කරනු ලබයි.

- **කාර්යයන්**

  - මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා නිවාරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සමීක්ෂණ සහ වෛද්‍ය, සමාජ, නෛතික, ආර්ථික සහ සංස්කෘතික කාරණා සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම
  - මත්ද්‍රව්‍ය සම්න්ධයෙන් රසායනික විශ්ලේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාක්ෂි මත පදනම්වූ විද්‍යාත්මක නිර්දේශයන් ලබාදීම සහ පූර්ව රසායන ද්‍රව්‍ය පාලනය කිරීම
  - මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම

## 2.6.2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්තුමය ප්‍රගතිය

ආයතනයේ අරමුණු ඉටු කිරීම සඳහා මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රධාන අංශ හතක් යටතේ කාර්යයන් ඉටු කරනු ලැබේ. එහි ප්‍රගතිය පහත පරිදි වේ.

- **පර්යේෂණ අංශය**

2023 වර්ෂයේදී පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම, මෙතැම්පිටමින් ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය, ප්‍රජාපාදක ප්‍රතිකාරය පිළිබඳ තක්සේරුකරණය, මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය, මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පිළිබඳ තක්සේරුකරණ අධ්‍යයනය යන සමීක්ෂණ ආරම්භ කර ඇති අතර මේ වන විට සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව **-37**

| යෝජිත ඉලක්කගත වැඩසටහන | වර්ෂය සඳහා යෝජිත වැඩසටහන් සංඛ්‍යාව | සිදු කර ඇති වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම | 05 | 03 |
| පුහුණු වැඩමුලු සහ පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ සැසි, ජාත්‍යන්තර හා ජාතික පර්යේෂණ සැසි සඳහා පත්‍රිකා ඉදිරිපත් කිරීම | වැඩමුලු - 04<br>පර්යේෂණ පත්‍රිකා සැසි- 12 | වැඩමුලු - 01<br>පර්යේෂණ පත්‍රිකා - 04 |
| පර්යේෂණ ප්‍රකාශන | 05 | 03 |
| අන්තර්ජාතික ආයතන සමඟ තොරතුරු හුවමාරුව | 16 | 12 |
| දත්ත පද්ධති කළමනාකරණය | 01 | 01 |
| ප්‍රවණතා විශ්ලේෂණය | 08 | 06 |

- **ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය**

සංඛ්‍යා වගුව **-38**

| යෝජිත වැඩසටහන | වර්ෂය සඳහා යෝජිත වැඩසටහන් සංඛ්‍යාව | සිදු කර ඇති වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| සේවාලාභීන් සඳහා මනෝ විද්‍යාත්මක උපදේශන සේවා සිදු කිරීම | 3000 | 1142 |
| සේවාලාභීන් නේවාසික ප්‍රතිකාර වැඩසටහනට සම්බන්ධ කර ගැනීම | 1000 | 582 |
| පසුරැකවරණ කටයුතු සිදු කිරීම | 3500 | 2275 |
| වෘත්තීය පුහුණු සහ මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් | 100 | 95 |
| කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා පවත්වන පුහුණු සැසි | 25 | 44 |
| **එකතුව** | **7625** | **4138** |

- **නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය**

නාමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ නව ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රමවේද හඳුන්වාදීමේ වැඩසටහන් පැවැත්වීම, පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, නාමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර) අධීක්ෂණය කිරීම සිදු කල අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා වගුව **-39**

| **යෝජිත ඉලක්කගත වැඩසටහන** | **වර්ෂය සඳහා යෝජිත වැඩසටහන් සංඛ්‍යාව** | **සිදු කර ඇති වැඩසටහන් සංඛ්‍යාව** |
|---|---|---|
| නාමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානවල නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 02 | 01 |
| පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 03 | 02 |
| කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ සහ නව ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රමවේද හඳුන්වාදීමේ වැඩසටහන් පැවැත්වීම | 03 | 01 |
| අංශයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 02 | 01 |
| අංශයේ කාර්යය මණ්ඩලයේ ප්‍රගතිය විමසීම සඳහා මාසික රැස්වීම් පැවැත්වීම | 08 | 06 |
| බලපත්‍ර නිකුත් කිරීම | 12 | 12 |
| බන්ධනාගාර (අධීක්ෂණය කිරීම) | 16 | 11 |
| පුනරුත්ථාපන  මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම | 40 | 28 |
| අධීක්ෂණය කරන ලද මධ්‍යස්ථාන පිළිබඳ වාර්තා සකස් කිරීම | 56 | 39 |
| 2007 අංක 54 දරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ පනත සහ 2010 අංක 1653/19 දරන ගැසට් පත්‍රය සංශෝධනය කිරීම | 01 | 01 |
| විශේෂ වැඩසටහන් | 03 | 2 |
| පුද්ගල උපදේශන | 800 | 790 |
| කණ්ඩායම් උපදේශන | 120 | 115 |
| පවුල් උපදේශන | 40 | 34 |
| මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන වැඩසටහන් | 70 | 65 |
| **එකතුව** | **1176** | **1108** |

- **නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය**

සංඛ්‍යා වගුව -40

| නිවාරණ ප්‍රවේශය /වැඩසටහනේ නම | වැඩසටහන් සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉලක්ක ගත ප්‍රමාණය | සම්පූර්ණ කරන ලද ප්‍රමාණය |
| පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 600 | 685 |
| ජාත්‍යන්තර පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 | 19 |
| දෙමාපියන් දැනුවත් කිරීම | 200 | 153 |
| ගුරු පුහුණු වැඩසටහන් | 20 | 33 |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 30 | 24 |
| දහම් පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 100 | 59 |
| **තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණය** | | |
| තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 150 | 172 |
| තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන් | 20 | 17 |
| විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 | 27 |
| **පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය** | | |
| පවුල් පාදක දැනුවත් කිරීමේ වැඩසටහන් | 150 | 48 |
| උපදේශන වැඩසටහන් | 200 | 240 |
| **වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය** | | |
| රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 150 | 62 |
| රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම | 50 | 28 |
| සෞඛ්‍ය අංශය ආශ්‍රිත පිරිස් දැනුවත් කිරීම | 20 | 36 |
| නීතිය බලගැන්වීමේ අංශයන් දැනුවත් කිරීම | 55 | 35 |
| විශාල වැඩබිම් ආශ්‍රිත දැනුවත් කිරීම(B.O.I) | 40 | 54 |
| වතු ආශ්‍රිත පිරිස් දැනුවත් කිරීම | 10 | 04 |
| **මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය** | | |
| පුවත් පත් ලිපි සහ අනෙකුත් පුවත් පත් පළ කිරීම් | 12 | 0 |
| ගුවන් විදුලි වැඩසටහන් | 21 | 25 |
| රූපවාහිණී වැඩසටහන් | 50 | 41 |
| මත්ද්‍රව්‍ය නිවාරණය මාධ්‍ය මැදිහත්කරුවන් පුහුණු කිරීම | 02 | 02 |
| **සමාජ මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම්** | | |
| Art of Living) පළකිරීම් | 50 | 19 |
| Machan )පළකිරීම් | 30 | 0 |
| Talk with Counselor (කෙටි වීඩියෝ පටි) | 03 | 2 |
| **පාරිසරිසක පාදක මත්ද්‍රව්‍ය නිවාරණය** | | |
| ප්‍රජා බලගැන්වීමේ වැඩසටහන් | 300 | 247 |
| ප්‍රජා බලගැන්වීමේ පුහුණු වැඩසටහන් | 05 | 6 |
| ප්‍රදර්ශන | 20 | 03 |
| ජාත්‍යන්තර කාන්තා දින සැමරුම | 10 | 13 |
| මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීති විරෝධි පිටු දැකීමේ ජාත්‍යන්තර දිනය | 01 | 02 |
| ලෝක ළමා දිනය | 10 | 0 |
| නිවාරණය ආශ්‍රිතය මෙවලම් සංවර්ධනය | 15 | 0 |
| ප්‍රතිපත්ති සම්පාදකයන්ට විශේෂඥතා ලබා දීම | 03 | 17 |
| **එකතුව** | **2347** | **2073** |

- **ජාතික මාදක රසායනාගාරය**

සංඛ්‍යා වගුව - **41**

| වැඩසටහන | ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව | සිදු කරන ලද ප්‍රමාණය |
|---|---|---|
| මාදක හා මනෝවර්ධන ද්‍රව්‍ය අඩංගු බවට සැක කරන සාම්පල විශ්ලේෂණය කිරීම | 40 | 70 |
| මෙතම්ෆෙටමින් ගුනාංගීකරණය අධ්‍යනය සහ සංශුද්ධතාවය සම්බන්ධ විශ්ලේෂණය | 100 | 75 |
| විද්‍යාත්මක නිර්දේශ සහ උපදේශන සේවා | 08 | 15 |
| නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් සඳහා බුද්ධිමය වර්ධන වැඩසටහන් | 25 | 25 |
| මත්ද්‍රව්‍ය සම්බන්ධ නියාමන සඳහා තාක්ෂණික සහාය සැපයීම | 12 | 10 |
| දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම | 140 | 836 |
| ප්‍රතිකාර ක්ෂේත්‍රයේ වෛද්‍ය සහ උපදේශන වෘත්තිකයින්ගේ ධාරිතා වර්ධනය | 04 | 03 |
| විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා උපකරණ පුහුණු සහ සීමාවාසික සැසි | 100 | 75 |
| UNODC විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස සඳහා සහභාගී වීම | 100 | 50 |

- **බාහිර සේවා අංශය**

සංඛ්‍යා වගුව - **42**

| වැඩසටහන | ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව | **2023.09.30** දිනට ප්‍රගතිය |
|---|---|---|
| මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හඳුනාගැනීම. | 6000 | 2878 |
| ප්‍රතිකාර සේවාවන් සඳහා යොමු කිරීම | 2000 | 2542 |
| ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් | 200 | 656 |
| උපදේශන සේවාවන් (පුද්ගල උපදේශනය) | 4000 | 2979 |
| උපදේශන සේවාවන් (කණ්ඩායම් උපදේශනය) | 2000 | 359 |
| පසුරැකවරණ සේවාවන් සැපයීම | 6000 | 4254 |
| ගොඩවැදීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 04 | 02 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන අධ්‍යාපන අංශය, රාජ්‍ය අංශ, නීතිය ක්‍රියාත්මක කරන අංශ, සෞඛ්‍ය අංශ, ප්‍රවාහන අංශ, වැඩබිම් සේවකයින්, වතු ප්‍රජාව, අධි අවදානම් කණ්ඩයාම්, සඳහා | 1,008 | 503 |
| මත්ද්‍රව්‍ය නිවාරණ සඳහා කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහන් | 60 | 10 |
| ධාරිතා සංවර්ධන වැඩසටහන්-බාහිර සේවා නිලධාරීන් සඳහා | 1 | 1 |
| ධාරිතා සංවර්ධන වැඩසටහන්-සංවර්ධන නිලධාරීන් සඳහා | 16 | 06 |
| මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් | 200 | 367 |
| විශේෂ අවස්ථා වල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 9 | 9 |
| පෝස්ටර් සහ අත්පත්‍රිකා ඇතුළු නිවාරණ ආධාරක | 04 | 06 |
| **සමස්ත ප්‍රගතිය** | **21,502** | **14,572** |

- **පුරෝගාමී පාලන අංශය**
  - මෙම අංශය මඟින් අයදුම්පත් ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, පරිශ්‍ර විමර්ශනය, කාර්තුමය වාර්තා සත්‍යාපනය කිරීම, ආනයන වලට අදාළ පූර්ව අපනයන වාර්තා සමාලෝචනය කිරීම, ප්‍රධාන වශයෙන් සිදු කරන අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

**සංඛ්‍යා වගුව -43**

| යෝජිත ඉලක්කගත වැඩසටහන | යෝජිත වැඩසටහන් සංඛ්‍යාව | 2023.09.30 දිනට වැඩසටහන් |
|---|---|---|
| බලපත්‍ර /ලියාපදිංචි සහතික නිකුත් කිරීම | 713 | 464 |
| පරිශ්‍ර විමර්ශනය | 96 | 20 |
| ආනයන වල පූර්ව අපනයන වාර්තා සමාලෝචනය කිරීම | 160 | 111 |
| කාර්තුමය වාර්තා සත්‍යාපනය කිරීම (ආනයන/අපනයන බලපත්‍ර ලාභීන් විසින් යොමු කරන ත්‍රෛ මාසික වාර්තා) | 476 | 280 |
| වාර්තා පිළියෙළ කිරීම සහ සහ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලයට (INCB) ඒවා යොමු කිරීම (Form D) | 1 | - |
| රසායනික කර්මාන්ත හා වෙළඳාම සඳහා පුහුණු වැඩසටහන් | 4 | 4 |
| පුරෝගාමී රසායනික ද්‍රව්‍ය හා සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට තාක්ෂණික සහාය ලබාදීම | 4 | 2 |
| පුරෝගාමී රසායනික ද්‍රව්‍ය වල භුවමාරුව නිරීක්ෂණය සඳහා ගුවන් තොටුපලවල සහ වරායන්හි නිරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>• රේගුවේ මාර්ගගත පද්ධතියට ප්‍රවේශය ලබාගැනීම | 1 | - |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 2 | 3 |

- **බලපත්‍ර හා ලියාපදිංචි සහතික මගින් ලැබූ අදායම**

**සංඛ්‍යා වගුව - 44**

| ප්‍රගතිය හෝ අගයන් | 2022.01.01 සිට 2022.09.30 දක්වා (රු,000) | 2023.01.01 සිට 2023.09.30 දක්වා (රු,000) |
|---|---|---|
| මුළු ආදායම | 5,587 | 7,997 |

## 2.6.3 මූල්‍ය ප්‍රගතිය

2023 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ වර්ෂයේ මුල් කාර්තු 03 තුළ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්යයන් සඳහා ලද ප්‍රතිපාදනවලින් දරා ඇති වියදම් සාරාංශය පහත පරිදි වේ.

**සංඛ්‍යා වගුව - 45**

| 2023 ප්‍රතිපාදන (රු,000) | | 2023.09.30 දක්වා වියදම (රු,000) | | වියදම් ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 330,880 | 20,000 | 204,977 | 55 | 62% | 0.3 |